# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1988 අංක 57 දරන බහු පාර්ශ්වික ආයෝජන ඇප සහතික ඒජන්සි පනත

---

[සහතිකය සටහන් කළේ 1988 දෙසැම්බර් 17 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1988 දෙසැම්බර් මස 23 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබා ගත හැක

මිල : රු. 3.45 යි. තැපැල් ගාස්තුව : රු. 2.30 යි.

# 1988 අංක 57 දරන බහුපාර්ශ්වික ආයෝජන ඇප සහතික ඒජන්සි පනත

[සහතිකය සටහන් කළේ 1988 දෙසැම්බර් මස 17 වන දින]

එල්. ඩී.—ඕ. 16/87.

**බහු පාර්ශ්වික ආයෝජන ඇප සහතික ඒජන්සිය පිහිටුවීමේ සම්මුතිය යටතේ ශ්‍රී ලංකාවට ස්වකීය වගකීම ඉටු කළ හැකිවීම සඳහා වූ පනතකි.**

බහු පාර්ශ්වික ආයෝජන ඇප සහතික ඒජන්සිය පිහිටුවීමේ සම්මුතියට 1986 ඔක්තෝබර් මස 03 වන දින ශ්‍රී ලංකාව අත්සන් තබන පාර්ශ්වකරුවකු වූ හෙයින් ද :

ඒ සම්මුතිය යටතේ ශ්‍රී ලංකාවට ස්වකීය වගකීම් ඉටු කළ හැකි වීම සඳහා නෛතික විධිවිධාන සැලැස්වීම අවශ්‍ය වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

*ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.*

1. මේ පනත 1988 අංක 57 දරන බහු පාර්ශ්වික ආයෝජන ඇප සහතික ඒජන්සි පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, (මෙහි මින්මතු "සම්මුතිය" යනුවෙන් සඳහන් කරනු ලබන) බහු පාර්ශ්වික ආයෝජන ඇප සහතික ඒජන්සිය පිහිටුවීමේ සම්මුතිය සහ මේ පනතේ උපලේඛනයෙහි දක්වා ඇති එහි විධිවිධාන ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් බලාත්මක විය යුතු දිනය ලෙස අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමය මගින් සහතික කරනු ලබන දිනයෙහි සිට එය ක්‍රියාත්මක විය යුතු ය.

*ඒජන්සිය වෙත නෝට්ටු නිකුත් කිරීමේ බලය.*

2. සම්මුතිය මගින් පිහිටුවන ලද (මෙහි මින්මතු "ඒජන්සිය" යනුවෙන් සඳහන් කරනු ලබන) බහු පාර්ශ්වික ආයෝජන ඇප සහතික ඒජන්සිය වෙත සම්මුතියේ 7 වන ව්‍යවස්ථාවේ (i) වන ඡේදය යටතේ ශ්‍රී ලංකාවේ වගකීම් ඉටු කිරීම පිණිස අවශ්‍ය වන ගණුදෙනු කළ නොහැකි සහ පොලී රහිත පොරොන්දු නෝට්ටු සහ හෝ සමාන බැඳීම්, අමාත්‍යවරයා විසින් ආණ්ඩුව වෙනුවෙන් ඇති කොට ඒජන්සිය වෙත නිකුත් කරනු ලැබිය යුතු ය.

*ඒකාබද්ධ අරමුදලින් ගෙවීම් කිරීම.*

3. ශ්‍රී ලංකාවේ ඒකාබද්ධ අරමුදලෙන්—

(අ) සම්මුතියේ 7 වන ව්‍යවස්ථාවේ (i) වන සහ (ii) වන ඡේද යටතේ ශ්‍රී ලංකාව විසින් ඒජන්සිය වෙත ගෙවිය යුතු වන ආරම්භක දායක මුදල ගෙවීම පිණිස කලින් කල අවශ්‍ය විය හැකි මුදල් ප්‍රමාණයන් ;

(ආ) සම්මුතියේ වෙනත් විධිවිධානයක් යටතේ ශ්‍රී ලංකාව විසින් ඒජන්සිය වෙත කලින් කල ගෙවිය යුතු වන මුදල් ප්‍රමාණයන් ; සහ

(ඇ) මේ පනතේ 2 වන වගන්තිය යටතේ ඒජන්සිය සම්බන්ධයෙන් ඇති කරන ලද හෝ එයට නිකුත් කරන ලද හෝ යම් නෝට්ටු හෝ බැඳීම් හෝ නිදහස් කර ගැනීම සඳහා අවශ්‍ය විය හැකි මුදල් ප්‍රමාණයන්

ගෙවනු ලැබිය යුතු ය.

2—ඩී 000914 —7,600 (88/09)

ආණ්ඩුවේ මුදල් නෝට්ටු නිකුත් කිරීම හෝ ශ්‍රී ලංකා මහ බැංකුව වෙත බැඳීම් දීම.

4. (1) 3 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකාවේ ඒකාබද්ධ අරමුදලෙන් ගෙවීමට අවශ්‍ය යම් මුදල් ප්‍රමාණයන් සැපයීමේ කාර්යය සඳහා, මුදල් විෂයය භාර අමාත්‍යවරයා සුදුසුයයි සිතන ආකාරයකට, පොලී නොදරන්නා වූ ද ගනුදෙනු කළ නොහැකි වූ ද නෝට්ටු හෝ බැඳීම් නිර්මාණය කර, ශ්‍රී ලංකා මහ බැංකුව වෙත නිකුත් කිරීම මගින්, ශ්‍රී ලංකාණ්ඩුව වෙනුවෙන් ණය ලබා ගැනීමට ඒ අමාත්‍යවරයාට මෙයින් බලය පවරනු ලැබේ.

(2) (422 වන අධිකාරය වූ) මුදල් නීති පනතේ කුමක් සඳහන්ව ඇත ද, මේ වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර, නිර්මාණ කර නිකුත් කරන ලද යම් නෝට්ටු හෝ බැඳීම් කිසිවක් භාර ගැනීමට සහ දැරීමට, ශ්‍රී ලංකා මහ බැංකුවට මෙයින් බලය පවරනු ලැබේ.

(3) මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ නිර්මාණය කර ශ්‍රී ලංකා මහ බැංකුව වෙත නිකුත් කරනු ලබන යම් නෝට්ටු හෝ බැඳීම් නිදහස් කර ගැනීම සඳහා අවශ්‍ය සියලු මුදල් ශ්‍රී ලංකාවේ ඒකාබද්ධ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

ලැබීම්.

5. ඒජන්සිය වෙතින්, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ එය වෙනුවෙන් හෝ—

(අ) සම්මුතියේ 16 වන ව්‍යවස්ථාව යටතේ ආපසු ගෙවීමක් ලෙස ;

(ආ) සම්මුතියේ 27 වන ව්‍යවස්ථාව යටතේ ශුද්ධ ආදායම බෙදා දීමක දී ;

(ඇ) සම්මුතියේ 55 වන ව්‍යවස්ථාව යටතේ ඒජන්සිය ගණුදෙනු කියවා වසා දැමීමක දී ; සහ

(ඈ) සම්මුතියේ වෙනත් යම් විධිවිධානයක් යටතේ,

ලබාගත් සියලු මුදල් ශ්‍රී ලංකාවේ ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

ඒජන්සියේ තත්ත්වය, භුක්තීන් සහ වරප්‍රසාද.

6. සම්මුතියේ 1 වන, 44 වන, 45 වන, 46 වන, 47 වන, 48 වන සහ 50 වන ව්‍යවස්ථාවේ විධිවිධාන, ශ්‍රී ලංකාවෙහි නීති බලය ඇතිය යුතු අතර, ඒ අනුව—

(අ) ඉහත කී 1 වන ව්‍යවස්ථාවෙහි නිශ්චිතව සඳහන් තත්ත්වය සහ ශක්‍යතාව ඒජන්සියට ශ්‍රී ලංකාවෙහි තිබිය යුතු ය ; තවද,

(ආ) ඉහත කී 44 වන, 45 වන, 46 වන, 47 වන සහ 48 වන ව්‍යවස්ථාවල නිශ්චිතව සඳහන් භුක්තීන් සහ වරප්‍රසාද ඉහත කී 50 වන ව්‍යවස්ථාවට යටත්ව, ඒජන්සියට සහ එහි නිලධරයන්ට ශ්‍රී ලංකාවේ තිබිය යුතු ය.

**7.** ශ්‍රී ලංකා මහ බැංකුව, සම්මුතියේ 37 වන ව්‍යවස්ථාවේ සඳහන් කාර්යයන් සඳහා ඒජන්සියේ ශ්‍රී ලංකාවෙහි භාරකරු විය යුතු යයි ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් ඒ ව්‍යවස්ථාව යටතේ නම් කරනු ලැබූ විට, ශ්‍රී ලංකා මහ බැංකුව එසේ භාරකරු විය යුතු ය.

මහ බැංකුව ඒජන්සිය සඳහා භාරකරු විය යුතු බව.

**8.** මේ පනතෙහි "මහ බැංකුව" යන්නෙන් (422 වන අධිකාරය වූ) මුදල් නීති පනතේ 5 වන වගන්තියෙන් පිහිටුවන ලද ශ්‍රී ලංකා මහ බැංකුව අදහස් වේ.

අර්ථ නිරූපණය.

2—ඕ 000914 (88/09)

# 1988 අංක 57 දරන බහුපාර්ශ්වික ආයෝජන ඇප සහතික ඒජන්සි පනත

**උපලේඛනය** (1 වන වගන්තිය)

**බහු පාර්ශ්වික ආයෝජන ඇප සහතික ඒජන්සිය පිහිටුවීමේ සම්මුතිය**

## පූර්විකාව

**ගිවිසුම්වලට එළඹෙන රාජ්‍යයෝ**

ආර්ථික සංවර්ධනය සඳහා ජාත්‍යන්තර සහයෝගිතාව ශක්තිමත් කිරීමේ අවශ්‍යතාව සහ එම සංවර්ධනය උදෙසා පොදුවේ විදේශ ආයෝජනවල සහ විශේෂයෙන් ම විදේශ පෞද්ගලික ආයෝජනවල දායකත්වය පිහිටාධාර කර ගැනීම සැලකිල්ලට ගෙන :

වාණිජ නොවන අවදානම්වලට අදාළ දුෂ්කරතා සැහැල්ලු කිරීම මගින් සංවර්ධනය වන රටවලට විදේශ ආයෝජන ගලා ඒම වඩාත් පහසු වී මැඩිදුරටත් උනන්දු කරවිය හැකි බව පිළිගනිමින් :

**සංවර්ධනය වන රටවල සංවර්ධන අවශ්‍යතාවලට, ප්‍රතිපත්තිවලට සහ අරමුණු** වලට ගැළපෙන්නා වූ කොන්දේසි යටතේ, විදේශ ආයෝජනවලට සැලකීමේ දී සාධාරණ සහ ස්ථාවර ප්‍රමිතියක පදනම මත නිෂ්පාදන කාර්යයන් සඳහා ප්‍රාග්ධනය සහ තාක්ෂණය සංවර්ධනය වන රටවලට ගලා ඒම නංවාලීමේ අභිලාෂයෙන් :

ජාතික සහ ප්‍රාදේශීය ආයෝජනවලට ඇප සහතික කිරීමේ වැඩ පිළිවෙලවල් සහ වාණිජ නොවන අවදානම් පිළිබඳ පෞද්ගලික රක්ෂකයන් ඌනපූරණය කිරීම පිණිස, විදේශ ආයෝජන උනන්දු කිරීමේදී බහු පාර්ශ්වික ආයෝජන ඇප සහතික ඒජන්සිය විසින් ඉටු කරනු ලැබිය හැකි වැදගත් කාර්ය භාරය ඒත්තු ගෙන :

එම ඒජන්සිය විසින්, එය ඉල්ලා සිටිය හැකි ප්‍රාග්ධනය පිටුවහල් කර නොගෙන එහි වගකීම් හැකිතාක් දුරට ඉටු කරනු ලැබිය යුතු බව සහ ආයෝජන තත්ත්වයන් දිගටම වර්ධනය කිරීම මගින්, එවැනි අරමුණක් ඉටු වන බව වටහා ගෙන

පහත දැක්වෙන පරිදි එකඟත්වයකට එළඹුනහ :—

## I වන පරිච්ඡේදය

### පිහිටුවීම, තත්ත්වය, කාර්යයන් සහ අර්ථකථන

**1 වන ව්‍යවස්ථාව : ඒජන්සිය පිහිටුවීම සහ එහි තත්ත්වය**

(අ) (මෙහි මින් මතු "ඒජන්සිය" යනුවෙන් හඳුන්වනු ලබන) බහු පාර්ශ්වික ආයෝජන ඇප සහතික ඒජන්සිය මෙයින් පිහිටුවනු ලැබේ.

(ආ) ඒජන්සියට පූර්ණ නෛතික පුද්ගලභාවය සතු විය යුතු අතර, විශේෂයෙන් ම,—

(i) ගිවිස ගැනීමේ ;

(ii) චංචල සහ නිශ්චල දේපළ අත්කර ගැනීමේ සහ බැහැර කිරීමේ ; සහ

(iii) නඩු කටයුතු පැවරීමේ

හැකියාව එයට තිබිය යුතුය.

**2 වන ව්‍යවස්ථාව : අරමුණ සහ අභිමතාර්ථ**

ඒජන්සියේ අරමුණ වන්නේ, (මෙහි මින් මතු 'බැංකුව' යනුවෙන් සඳහන් කරනු ලබන) ප්‍රතිසංස්කරණය සහ සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුවෙහි, ජාත්‍යන්තර මුදල් සංස්ථාවෙහි සහ වෙනත් ජාත්‍යන්තර සංවර්ධන මුදල් ආයතනවල කාර්යයන්ට පරිපූරක වන පරිදි, සාමාජික රටවල් අතර, විශේෂයෙන් ම සංවර්ධනය වන සාමාජික රටවලට නිෂ්පාදන කාර්යයන් සඳහා ආයෝජන ගලා ඒම උනන්දු කරලීමයි.

ඒජන්සියේ අරමුණ ඉෂ්ඨ කර ගැනීම සඳහා, ඒජන්සිය විසින්—

(අ) වෙනත් සාමාජික රටවල්වලින් යම් සාමාජික රටකට ගලා එන ආයෝජන පිළිබඳ වූ වාණිජ නොවන අවදානම් සම්බන්ධයෙන් සමූහ රක්ෂණය සහ ප්‍රතිරක්ෂණය ඇතුළුව ඇප සහතික නිකුත් කිරීම;

(ආ) සංවර්ධනය වන සාමාජික රටවල් වෙත සහ ඒ රටවල් අතර, ආයෝජන ගලා ඒම නංවාලීම සඳහා සුදුසු අනුපූරක කටයුතු කර ගෙන යාම; සහ

(ඇ) එහි අරමුණු තවදුරටත් ඉෂ්ඨ කර ගැනීමෙහි ලා අවශ්‍ය වන්නා වූ හෝ යෝග්‍ය වන්නා වූ වෙනත් ආනුෂංගික බලතල ක්‍රියාත්මක කිරීම

කරනු ලැබිය යුතුය.

ඒජන්සිය එහි සියළු තීරණවලදී මෙම ව්‍යවස්ථාවේ විධිවිධාන මගින් මෙහෙයවනු ලැබිය යුතුය.

3 වන ව්‍යවස්ථාව: අර්ථ නිරූපන

මේ සම්මුතියේ කාර්යයන් සඳහා—

(අ) "සාමාජික" යන්නෙන්, 61 වන ව්‍යවස්ථාවට අනුකූලව සම්මුතිය බලාත්මක වන්නේ යම් රාජ්‍යයක් වෙනුවෙන් ද, ඒ රාජ්‍යය අදහස් වේ.

(ආ) "ධාරක රට" හෝ "ධාරක ආණ්ඩුව" හෝ යන්නෙන්, ඒජන්සිය විසින් ඇප සහතික කරන ලද නැතහොත්, ප්‍රතිරක්ෂණය කරන ලද හෝ ඇප සහතික කිරීම නැතහොත් ප්‍රතිරක්ෂණය සඳහා සැලකිල්ලට ගන්නා ලද හෝ ආයෝජනයක් කරනු ලැබිය යුත්තේ යම් සාමාජික රටක, එහි ආණ්ඩුවක හෝ සාමාජික රටක යම් පොදු අධිකාරයක 66 වන ව්‍යවස්ථාවේ අර්ථ නිරූපිත යම් ප්‍රදේශයක ද ඒ ප්‍රදේශය අයත් සාමාජික රට, එහි ආණ්ඩුව හෝ එහි පොදු අධිකාරිය හෝ අදහස් වේ.

(ඇ) "සංවර්ධනය වන සාමාජික රටක්" යන්නෙන් මෙහි අ උපලේඛනයෙහි එවැනි සාමාජික රටක් ලෙස ලැයිස්තු ගත කරන ලද සාමාජික රටක් අදහස් වන අතර, මෙම උපලේඛනය 30 වන ව්‍යවස්ථාවෙහි සඳහන් (මෙහි මින් මතු "සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) පාලක සභාව විසින් කලින් කල සංශෝධනය කරනු ලැබිය හැකි ය.

(ඈ) "විශේෂ බහුතර ඡන්දය" යන්නෙන් ඒජන්සියේ ප්‍රාග්ධන ස්කන්ධයෙහි සියයට පනස් පහකට නොඅඩු ප්‍රමාණයක දායක මුදල් ගෙවනු ලැබූ කොටස් නියෝජනය කෙරෙන, මුළු ඡන්ද බලයෙන් තුනෙන් දෙකකට නොඅඩු පක්ෂව දෙනු ලබන ඡන්දයක් අදහස් වේ;

(ඉ) "නිදහස් ලෙස භාවිතා කළ හැකි ව්‍යවහාර මුදලක්" යන්නෙන්,—

(i) ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් කලින් කල එවැනි ව්‍යවහාර මුදලක් ලෙස නම් කරන ලද යම් ව්‍යවහාර මුදලක්; සහ

(ii) 30 වන ව්‍යවස්ථාවෙහි සඳහන් (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විමසා, එම ව්‍යවහාර මුදල නිකුත් කරන රටෙහි අනුමැතිය ඇතිව සම්මුතියේ කාර්යයන් සඳහා නම් කරනු ලබන්නා වූද, නිර්බාධිතව ලබා ගත හැකි සහ ඵලදායි ලෙස භාවිතා කළ හැකි වූද වෙනත් යම් ව්‍යවහාර මුදලක්

අදහස් වේ.

## II වන පරිච්ඡේදය

## සාමාජිකත්වය සහ ප්‍රාග්ධනය

4 වන ව්‍යවස්ථාව : සාමාජිකත්වය

(අ) නියෝජනායතනයේ සාමාජිකත්වය. බැංකුවෙහි සියළු සාමාජිකයින් සහ ස්විට්සර්ලන්තය වෙත විවෘතව තිබිය යුතුය.

(ආ) මෙහි 'අ' උපලේඛනයෙහි ලැයිස්තුගත කරනු ලැබ ඇත්තා වූ ද, 1987 ඔක්තෝබර් මස 30 වන දින හෝ ඒ දිනයට පෙර හෝ මේ සම්මුතියෙහි පාර්ශ්වකරුවන් වන්නා වූ ද රාජ්‍යයන් ආරම්භක සාමාජිකයන් විය යුතු ය.

5 වන ව්‍යවස්ථාව : ප්‍රාග්ධනය

(අ) ඒජන්සියේ අනුමත ප්‍රාග්ධන ස්කන්ධය විශේෂ ගැණුම් හිමිකම් බිලියන එකක් (වි. ගැ. හි. 1,000,000,000 ක්) විය යුතු ය. එක් කොටසකට වි. ගැ. හි. 10,000 කට සමාන වටිනාකම ඇති කොටස් 100,000 කට ප්‍රාග්ධන ස්කන්ධය බෙදනු ලැබිය යුතු අතර, ඒවා සාමාජිකයන්ගේ සහභාගිවීම සඳහා තිබිය යුතු ය. ප්‍රාග්ධන ස්කන්ධය සම්බන්ධයෙන් සාමාජිකයන් ගේ සියළු ගෙවීම් වගකීම්, 1981 ජනවාරි මස 1 වන දින සිට 1985 ජූනි මස 03 වන දිනය දක්වා වූ කාල සීමාව සඳහා එක්සත් රාජධානි ඩොලර යට අනුව, වි. ගැ. හි. හි සාමාන්‍ය වටිනාකම පදනම් කරගෙන බේරුම් කරනු ලැබිය යුතු ය. එම වටිනාකම වි. ගැ. හි ඒකකට එක්සත් රාජධානි ඩොලර් 1,082 ක් වන්නේ ය.

(ආ) නව සාමාජිකයකු ඇතුලත් කර ගනු ලැබූ විට 6 වන ව්‍යවස්ථාව ප්‍රකාර ඒ සාමාජිකයා විසින් සහභාගි විය යුතු කොටස් මුදල් සැලසීම සඳහා එවිට අනුමිත කොටස් ප්‍රමාණවත් නොවන විට එසේ ප්‍රමාණවත් වන දුරට ප්‍රාග්ධන ස්කන්ධය වැඩි විය යුතු ය.

(ඇ) සභාව විසින්, විශේෂ බහුතර ඡන්දයකු මගින්, ඕනෑම අවස්ථාවකදී ඒජන්සියේ ප්‍රාග්ධන ස්කන්ධය වැඩි කරනු ලැබිය හැකිය.

6 වන ව්‍යවස්ථාව : කොටස් සඳහා සහභාගි වීම

ඒජන්සියේ එක් එක් ආරම්භක සාමාජිකයා විසින්, මෙහි 'අ' උපලේඛනයේ ස්වකීය නාමය ඉදිරියේ දක්වා ඇති, ප්‍රාග්ධන ස්කන්ධයෙන් කොටස් සංඛ්‍යාවට සමාන වන පරිදි සහභාගි විය යුතු ය. වෙනත් එක් එක් සාමාජිකයා විසින්, සභාව විසින් තීරණය කරනු ලබන නියම හා කොන්දේසි මත ප්‍රාග්ධන ස්කන්ධයෙන් එවැනි කොටස් සංඛ්‍යාවකට සහභාගි විය යුතු අතර, එය කිසිම හේතුවක් නිසා වත් සමාන මුදලට අඩු නිකුත් කිරීමේ මිලකට නොවිය යුතු ය. කිසිම සාමාජිකයෙකු කොටස් පනහකට අඩු සංඛ්‍යාවකට සහභාගි නොවිය යුතුය. අනුමත කරන ලද ප්‍රාග්ධන ස්කන්ධයෙහි අතිරේක කොටස්වලට සාමාජිකයන් විසින් සහභාගි විය හැකි රීති, සභාව විසින් නියම කරනු ලැබිය හැකිය.

7 වන ව්‍යවස්ථාව : සහභාගි ප්‍රාග්ධනය බෙදීම සහ ඇරයුම්

එක් එක් සාමාජිකයාගේ ආරම්භක සහභාගී මුදල පහත දැක්වෙන ආකාරයට ගෙවනු ලැබිය යුතු ය:—

(i) එම සාමාජිකයා සම්බන්ධයෙන් මෙම සම්මුතිය බලාත්මක වූ දින සිට දින අනූවක් ඇතුලත 8 වන ව්‍යවස්ථාවේ (අ) වගන්තියේ නියම කර ඇති පරිදි එක් එක් කොටසෙහි වටිනාකමින් සියයට දහයක් ද, ඊට අමතරව, ඒජන්සියේ වගකීම් ඉටු කිරීම පිණිස, මණ්ඩලයේ තීරණයක් ප්‍රකාර මාරුකර ගැනීම පිණිස, ගණුදෙනු කළ නොහැකි, පොලී නොදරන පොරොන්දු නෝට්ටු හෝ ඒ සමාන බැඳීම්වල හෝ ස්වරූපයේ සියයට දහයක් ද ගෙවනු ලැබිය යුතුය.

(ii) ඉතිරිය ස්වකීය වගකීම් ඉටු කිරීම පිණිස ඒජන්සියට අවශ්‍ය වන විට, ඒජන්සිය විසින් ඇරයුම් කරනු ලැබීමට යටත් විය යුතු ය.

8 වන ව්‍යවස්ථාව : කොටස් සඳහා සහභාගිවීමේ ගෙවීම

(අ) 7(1) වන ව්‍යවස්ථාව යටතේ තමන් විසින් ගෙවනු ලැබිය යුතු සහභාගි මුදලෙහි මුදලින් ගෙවිය යුතු කොටසින් සියයට විසිපහක් දක්වා, සංවර්ධනය වන සාමාජික රටවල් විසින් තම ව්‍යවහාර මුදලින් ගෙවනු ලැබිය හැකි වීම හැරුණු විට, සහභාගිවීමේ ගෙවීම නිර්බාධිතව භාවිතා කරනු ලැබිය හැකි ව්‍යවහාර මුදලින් ගෙවනු ලැබිය යුතුය.

(ආ) නොගෙවා ඇති සහභාගි මුදල්වලින් කිසියම් කොටසක් ගෙවන ලෙස කරනු ලබන ඇරයුම්, සියලු කොටස් සම්බන්ධයෙන් ඒකාකාර විය යුතු ය.

(ඇ) ඇරයුමක දී ඒජන්සිය වෙත ලැබෙන මුදල, එම ඇරයුම් කිරීමේ අවශ්‍යතාව ඇති කළ වගකීම ඉටු කිරීම සඳහා ප්‍රමාණවත් නොවන්නේ නම්, ඒජන්සිය වෙත ලැබෙන මුදලෙහි එකතුව එම වගකීම ඉටු කිරීමට ප්‍රමාණවත් වන තුරු නොගෙවා ඇති සහභාගි මුදල සම්බන්ධයෙන් ඒජන්සිය විසින් නැවත නැවතත් වැඩිදුර ඇරයුම් ඉදිරිපත් කරනු ලැබිය හැකිය.

(ඈ) කොටස් මුදල් සම්බන්ධයෙන් වගකීම, නිකුත් මිලෙහි නොගෙවන ලද කොටසට සීමා විය යුතු ය.

9 වන ව්‍යවස්ථාව : ව්‍යවහාර මුදල් තක්සේරු කිරීම

එක් ව්‍යවහාර මුදලක වටිනාකම, වෙනත් ව්‍යවහාර මුදලකින් ප්‍රමාණ කිරීමට මේ සම්මුතියේ කාර්යයන් සඳහා අවශ්‍ය වන්නා වූ කවර අවස්ථාවක වුවද, එම වටිනාකම ඒජන්සිය විසින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විමසීමෙන් පසුව, සාධාරණ ලෙස නිර්ණය කරනු ලැබිය යුතු ය.

10 වන ව්‍යවස්ථාව : ආපසු ගෙවීම්

(අ) දායක ප්‍රාග්ධනය මත ඇරයුම් අනුව ගෙවන ලද මුදල් :—

(i) එම ඇරයුම කරන ලද්දේ ඇප සහතිකවීමේ හෝ ප්‍රතිරක්ෂණ හෝ ගිවිසුමක ප්‍රතිඵලයක් වශයෙන් හිමිකම් පෑමක් ගෙවීම සඳහා නම් සහ, ඉන් ඉක්බිතිව එම ගෙවීම, නිර්බාධිතව භාවිතා කළ හැකි ව්‍යවහාර මුදලින් සම්පූර්ණයෙන් හෝ කොටසක් වශයෙන් ඒජන්සිය විසින් අය කර ගනු ලැබ ඇත්නම් ; හෝ

(ii) එම ඇරයුම කරන ලද්දේ, සාමාජිකයෙකු විසින් ගෙවීම් සම්බන්ධයෙන් කරන ලද පැහැර හැරීමක් නිසා නම් සහ, ඉන් ඉක්බිතිව ඒ සාමාජිකයා විසින, එම ගෙවීම් පැහැර හැර ඇති මුදල සම්පූර්ණයෙන් හෝ කොටසක් වශයෙන් හෝ පියවනු ලැබ ඇත්නම් ; හෝ

(iii) ඒ මුදල් සම්පූර්ණයෙන් හෝ ඉන් කොටසක් හෝ ඒජන්සියේ ආදායමෙන් ආපසු ගෙවීමට ඒජන්සියේ මුදල් තත්ත්වය අනුව අවස්ථාව සැලසේ යයි, සභාව විසින් විශේෂ බහුතර ඡන්දයක් මගින් තීරණය කරනු ලබයි නම් ; හෝ

ඒ ප්‍රමාණයට පහසු හැකි ඉක්මණින් ඒජන්සිය විසින් සාමාජිකයන් වෙත ආපසු ගෙවනු ලැබිය යුතුය.

(ආ) මේ ව්‍යවස්ථාව යටතේ සාමාජිකයකු වෙත කරනු ලබන යම් ආපසු ගෙවීමක්, එම ආපසු ගෙවීමට පෙරාතුව කරන ලද ඇරයුම් ප්‍රකාර, ඒ සාමාජිකයා විසින් ගෙවන ලද මුදල මුළු ගෙවීම්වලට දරන අනුපාතය අනුව නිර්බාධිතව භාවිතා කල හැකි ව්‍යවහාර මුදලින් කරනු ලැබිය යුතුය.

(ඇ) සාමාජිකයෙකු වෙත මේ ව්‍යවස්ථාව යටතේ ආපසු ගෙවන ලද මුදල්වලට සමාන ප්‍රමාණය, 7 (ii) වන ව්‍යවස්ථාව යටතේ සාමාජිකයාගෙන් ඇරයුම් කර සිටිය හැකි ප්‍රාග්ධන වගකීමෙහි කොටසක් විය යුතුය.

## III වන පරිච්ඡේදය

### මෙහෙයවුම්

11 වන ව්‍යවස්ථාව : ආවරණිත අවදානම්

(අ) පහත දැක්වෙන අවදානම් වර්ග එකකින් හෝ ඊට වැඩි ගණනකින් උද්ගත වන අලාභවලට එරෙහිව, ඒජන්සිය විසින් පහත (ආ) සහ (ඇ) වගන්තිවල විධිවිධානවලට යටත් ව, යෝග්‍ය ආයෝජිත සම්බන්ධයෙන් ඇප සහතික කරනු ලැබිය හැකි ය.

(i) ව්‍යවහාර මුදල් මාරු කිරීම.—ව්‍යවහාර මුදල් දරන්නා විසින්, එම මුදල් මාරු කිරීම සඳහා කරනු ලැබූ ඉල්ලීමක් සම්බන්ධයෙන් ධාරක ආණ්ඩුව සාධාරණ කාල සීමාවක් ඇතුළත කටයුතු කිරීම පැහැර හැරීමක් ඇතුළුව, ධාරක රටෙහි ව්‍යවහාර මුදල නිර්බාධිතව භාවිතා කළ හැකි ව්‍යවහාර මුදලකට හෝ ඇප සහතිකය දරන්නාට පිළිගත හැකි වෙනත් ව්‍යවහාර මුදලකට හෝ ධාරක රටින් පිටත මාරු කිරීම සම්බන්ධයෙන් ධාරක ආණ්ඩුව විසින් පනවන ලද යම් සීමා ;

(ii) අහිමි කිරීම සහ සමාන පියවරවල්.—ස්වකීය දේශවල ආර්ථික ක්‍රියාවලිය විධිමත් කිරීමේ කාර්යය සඳහා ආණ්ඩු විසින් සාමාන්‍යයෙන් ගනු ලබන්නා වූ ද පොදු අදාළ වීමක් ඇත්තා වූද වෙනස් ලෙස සැලකීමක් කරනු නොලබන පියවරවල් හැර ඇප සහතිකයක් දරන්නාට තම ආයෝජනයෙහි අයිතිය හෝ පාලනය හෝ විසින් සැලකිය යුතු ප්‍රතිලාභයක් හෝ අහිමි කිරීමේ ප්‍රතිඵලය තිබෙන, ධාරක ආණ්ඩුවට දෝෂය පැවරිය හැකි යම් ව්‍යවස්ථාදායක ක්‍රියාවක් හෝ පරිපාලනමය ක්‍රියාවක් හෝ අත්හැරීමක් ;

(iii) ගිවිසුම් කඩ කිරීම.—

(අ) ඇප සහතිකයක් දරන්නාට, ප්‍රතික්ෂේප කිරීම හෝ කඩ කිරීම හෝ සම්බන්ධයෙන් තම හිමිකම් පෑම තීරණය කර ගැනීම සඳහා අධිකරණ හෝ බේරුම්කාර මණ්ඩලයක පිහිට නොතිබෙන්නා වූ ; හෝ

(ආ) ඒජන්සියේ නියෝග ප්‍රකාර ඇප සහතික ගිවිසුම්වල නියම කර ඇති පරිදි වූ සාධාරණ කාල සීමාවක් ඇතුළත එවැනි මඬුල්ලක් විසින් තීරණයක් දෙනු නොලබන්නා වූ ; හෝ

(ඇ) එවැනි තීරණයක් ක්‍රියාත්මක කළ නොහැකි වූ හෝ

විට ඇප සහතිකයක් දරන්නා සමග ඇති ගිවිසුමක් සම්බන්ධයෙන් ධාරක ආණ්ඩුව විසින් කරනු ලැබූ යම් ප්‍රතික්ෂේප කිරීමක් හෝ කඩ කිරීමක් ; සහ

(iv) යුද්ධය සහ අභ්‍යන්තර කලබල.—

(අ) 66 වන ව්‍යවස්ථාවෙහි විධිවිධාන සලසා ඇති පරිදි, මේ සම්මුතියට අදාළ වන ධාරක රටෙහි යම් ප්‍රදේශයක යම් හමුදා ක්‍රියාවක් හෝ අභ්‍යන්තර කලබලයක් ;

(ආ) ආයෝජක සහ ධාරක රට විසින් එක්ව කරනු ලබන ඉල්ලීමක් මත ඉහත (අ) වගන්තියෙහි සඳහන් අවදානම් නොවන, නිශ්චිත අවදානම් සඳහා මේ ව්‍යවස්ථාව යටතේ ආවරණය ව්‍යාප්ත කිරීම, මණ්ඩලය විසින් විශේෂ බහුතර ඡන්දයෙන් කරනු ලැබිය හැකි නමුත්, කිසිදු අවස්ථාවක මෙය ව්‍යවහාර මුදල් අවප්‍රමාණ කිරීමේ හෝ, එම මුදල්වල අගය අඩුවීමේ හෝ අවදානම කෙරෙහි අදාළ නොවිය යුතු ය ;

(ඇ) පහත දැක්වෙන කරුණු නිසා උද්ගත වන අලාභ ආවරණය නොවිය යුතුය :—

(i) ඇප සහතිකය දරන්නා එකඟ වී ඇත්තා වූ හෝ ඔහු වගකිව යුතුව සිටින්නා වූ හෝ ධාරක ආණ්ඩුවේ යම් ක්‍රියාවක් හෝ අත් හැරීමක් ; සහ

(ii) ඇප සහතික ගිවිසුම නිම වීමට පෙර, ධාරක ආණ්ඩුවේ ක්‍රියාවක් හෝ අත් හැරීමක් හෝ වෙනත් යම් සිද්ධියක්.

12 වන ව්‍යවස්ථාව : සුදුසු ආයෝජන

(අ) අදාළ ව්‍යවසායෙහි හිමිකාර ප්‍රාග්ධනය දරන්නන් විසින් දෙන ලද හෝ ඇප සහතික කරන ලද හෝ මධ්‍ය කාලීන හෝ දීර්ඝ කාලීන හෝ ණය ද මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි වෙනත්, ආකාරයේ සෘජු ආයෝජන ද ඇතුළුව හිමිකාර ප්‍රාග්ධන සම්බන්ධතා සුදුසු ආයෝජනවලට ඇතුළත් වේ.

(ආ) මණ්ඩලය විසින් විශේෂ බහුතර ඡන්දයෙන් මෙම සුදුසුකම, වෙනත් යම් ආකාරයක මධ්‍ය හෝ දීර්ඝ කාලීන ආයෝජනයකට ව්‍යාප්ත කරනු ලැබිය හැකි ය. එහෙත් ඉහත (අ) වගන්තියෙහි සඳහන් ණය නොවන වෙනත් ණය, සුදුසු විය හැක්කේ, එම ණයදායියා මගින් ආවරණය කෙරෙතොත් එසේ ආවරණය කිරීමට ඇති නිශ්චිත ආයෝජනයකට අදාළ වන්නේ නම් පමණය.

(ඇ) ඇප සහතික කරනු ලැබීම සඳහා ඉල්ලුම් පත්‍රය, ඒජන්සිය විසින් ලියාපදිංචි කරනු ලැබීමෙන් ඉක්බිතිව, ක්‍රියාත්මකවීම ආරම්භ වන ආයෝජනවලට ඇප සහතික කිරීම සීමා විය යුතු ය. එම ආයෝජනවලට—

(i) පවත්නා ආයෝජනයක්, නවීකරණය කිරීම, ව්‍යාප්ත කිරීම හෝ සංවර්ධනය කිරීම පිණිස, විදේශ විනිමයවල යම් පැවරීමක් ; සහ

(ii) පවත්නා ආයෝජනවලින් උද්ගත වන්නා වූ ද ධාරක රටින් පිටතට මාරු කරනු ලැබිය හැකි වූ ද ඉපයුම් පාවිච්චියට ගැනීමක්

ඇතුළත් විය හැකිය.

(ඈ) ආයෝජනයක් සහතික කිරීමේ දී,—

(i) ආයෝජනයේ ආර්ථිකමය යෝග්‍යතාව සහ ධාරක රටේ සංවර්ධනයට එයින් සිදුවන සේවය ;

(ii) ධාරක රටෙහි නීතිවලට සහ නියෝගවලට එම ආයෝජනයෙහි අනුකූලතාව ;

(iii) ධාරක රටේ ප්‍රකාශිත සංවර්ධන අරමුණු සහ ප්‍රමුඛතා සමග ආයෝජනයෙහි ඇති අනුකූලතාව ; සහ

(iv) යුක්ති සහගත සහ සාධාරණ සැලකිල්ල තිබීම සහ ආයෝජනය සඳහා නීතිමය ආරක්ෂාව ඇතුළුව, ධාරක රටෙහි ආයෝජන පරිසරය

සම්බන්ධයෙන් ඒජන්සිය සෑහීමට පත් විය යුතුය.

13 වන ව්‍යවස්ථාව : සුදුසු ආයෝජකයෝ

(අ) යම් ස්වාභාවික පුද්ගලයකු සහ නෛතික පුද්ගලයකු,—

(i) එම ස්වාභාවික පුද්ගලයා ධාරක රට නොවන, වෙනත් සාමාජික රටක, රටවැසියකු නම් ;

(ii) එම නෛතික පුද්ගලයා, සංස්ථාගත වී සිටි නම් සහ ඔහුගේ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය, සාමාජික රට තුළ පිහිටා ඇත්නම් හෝ එහි ප්‍රාග්ධනයෙන් බහුතරය සාමාජික රටට හෝ සාමාජික රටවලට හෝ එහි රටවාසීන්ට හෝ අයත්ව තිබේ නම් සහ ඉහත අවස්ථාවලින් කිසිවක දී එම සාමාජික රට ධාරක රට නොවේ නම්,

(iii) එම නෛතික පුද්ගලයා, එය පෞද්ගලික අයිතියට යටත් වුව ද නොවුව ද වාණිජ පදනමක් මත මෙහෙයවයි නම්

ඒජන්සියේ ඇප සහතිකය ලැබීමට සුදුසු වන්නේ ය.

(ආ) ආයෝජකට එකකට වැඩි ජාතිකත්ව තිබෙන අවස්ථාවක, ඉහත (අ) වගන්තියේ කාර්යයන් සඳහා සාමාජිකයකුගේ ජාතිකත්වය, සාමාජිකයකු නොවන්නකුගේ ජාතිකත්වය අභිබවා බලපැවැත්විය යුතු ය. තවද ධාරක රටෙහි ජාතිකත්වය වෙනත් යම් සාමාජිකයකුගේ ජාතිකත්වය අභිබවා බලපැවැත්විය යුතු ය.

(ඇ) ආයෝජනය කරනු ලබන වත්කම් ධාරක රටින් පිටත සිට මාරු කරනු ලබන්නේ නම්, ආයෝජක සහ ධාරක රට විසින්, එක්ව කරනු ලබන ඉල්ලීමක් මත, මණ්ඩලය විසින් විශේෂ බහුතර ඡන්දයක් මගින් ධාරක රටෙහි ජාතිකයකු වන ස්වාභාවික තැනැත්තෙකු වෙත හෝ ධාරක රටෙහි සංස්ථාගත කරන ලද තැනැත්තෙක් ප්‍රාග්ධනයෙහි බහුතරය, එහි ස්වජාතිකයින්ට අයත්ව තිබෙන්නා වූ නෛතික පුද්ගලයකු වෙත හෝ සුදුසුකම ව්‍යාප්ත කරනු ලැබිය හැකිය.

14 වන ව්‍යවස්ථාව : සුදුසු ධාරක රටවල්

මේ පරිච්ඡේදය යටතේ ආයෝජන සහතික කරනු ලැබිය යුත්තේ ඒවා සංවර්ධනය වන සාමාජික රටක ප්‍රදේශයෙහි ආයෝජනය කරනු ලබන්නේ නම් පමණය.

**15 වන ව්‍යවස්ථාව: ධාරක රටෙහි අනුමැතිය**

ආවරණය සඳහා නම් කරන ලද අවදානම්වලට එරෙහිව ඒජන්සිය විසින් ඇප සහතිකය දීම ධාරක ආණ්ඩුව විසින් අනුමත කරනු ලැබීමට පෙරාතුව, ඒජන්සිය විසින් යම් ඇප ගිවිසුමකට ඇතුළත් වීම කරනු නොලැබිය යුතුය.

**16 වන ව්‍යවස්ථාව: නියම සහ කොන්දේසි**

එක් එක් ඇප ගිවිසුමෙහි නියම සහ කොන්දේසි මණ්ඩලය විසින් නිකුත් කරනු ලැබිය යුතු රීතිවලට සහ නියෝගවලට යටත්ව ඒජන්සිය මගින් තීරණය කරනු ලැබිය යුතුය. එසේ වුවද ඇප වූ ආයෝජනයෙහි මුළු අලාභය ඒජන්සිය විසින් ආවරණය කරනු නොලැබිය යුතුය. මණ්ඩලයේ විධානය යටතේ සභාපතිවරයා විසින් ඇප සහතික ගිවිසුම්, අනුමත කරනු ලැබිය යුතුය.

**17 වන ව්‍යවස්ථාව: හිමිකම් පෑම් සඳහා ගෙවීම**

ඇප සහතිකයක් දරන්නකුට හිමිකම් පෑම් සඳහා ගෙවීම පිළිබඳව, ඇප සහතික ගිවිසුමට සහ මණ්ඩලය විසින් පිළිගනු ලැබිය හැකි ප්‍රතිපත්තිවලට අනුකූලව මණ්ඩලයේ විධානය යටතේ සභාපතිවරයා විසින් තීරණය කරනු ලැබිය යුතු ය. ඒජන්සිය විසින් ගෙවීමක් කරනු ලැබීමට ප්‍රථම අවස්ථාගත තත්ත්වය අනුව යෝග්‍ය පරිපාලනමය ප්‍රතිකර්ම, ධාරක රටෙහි නීති යටතේ පහසුවෙන් ලබා ගත හැකි නම්, ඒ ප්‍රතිකර්මවල පිහිට පැතිය යුතු යයි ඇප සහතික ගිවිසුම මගින් ඇප සහතික දරන්නාට නියම කළ යුතුය. ගෙවීම් සඳහා හිමිකම් පෑම් උද්ගත වීමට තුඩුදුන් සිද්ධි සිදුවීම හා හිමිකම් පෑම්වලට ගෙවීම අතරතුර කිසියම් සාධාරණ කාල සීමාවක් ඉකුත් විය යුතු යැයි එම ගිවිසුම් මගින් නියම කරනු ලැබිය හැකිය.

**18 වන ව්‍යවස්ථාව: පුනරාදේශ කිරීම**

(අ) ඇප සහතිකයක් දරන්නකුට වන්දි ගෙවූ විට හෝ ගෙවීමට එකඟ වූ විට, ධාරක රටට සහ අනෙකුත් බන්ධනදායින්ට එරෙහිව ඇප සහතිකධාරියාට සහතික කරන ලද ආයෝජන හා සම්බන්ධව තිබිය හැකි අයිතිවාසිකම් හා හිමිකම් පෑම්වලට ඒජන්සිය පුනරාදේශ විය යුතු ය. එම පුනරාදේශයේ නියමයන් හා කොන්දේසි සඳහා ඇප සහතික ගිවිසුමෙහි විධිවිධාන ඇතුළත් විය යුතු ය.

(ආ) ඉහත (අ) වගන්තිය ප්‍රකාර ඒජන්සිය සතු අයිතිවාසිකම් සියළු සාමාජික යන් විසින් පිළිගත යුතු ය.

(ඇ) පුනරාදේශක වශයෙන් ඒජන්සිය විසින් (අ) වගන්තිය ප්‍රකාර අත්කර ගන්නා, ධාරක රටෙහි ව්‍යවහාර මුදලින් වූ මුදල් ප්‍රමාණයන් සම්බන්ධයෙන්, ඒ අරමුදල් ඇප සහතිකධාරියා අත වී නම් ප්‍රයෝජනයට ගැනීම සහ පරිවර්තනය කිරීම සම්බන්ධව ඔහුට ලැබීමට හිමිකම තිබිය හැකි වූ වාසිදායක සැලකිල්ල ම දෙනු ලැබිය යුතු ය. කවර ලෙසකින් වුව ද ඒ මුදල් ප්‍රමාණයන්, ඒජන්සිය විසින් සිය පරිපාලන වියදම් හා වෙනත් ගාස්තු සඳහා ප්‍රයෝජනයට ගත හැකි ය. ඒ ව්‍යවහාර මුදල් නිදහසේ ප්‍රයෝජනයට ගත නොහැකි වන ප්‍රමාණයට, ඒ ව්‍යවහාර මුදල් වෙනත් අයුරින් ප්‍රයෝජනයට ගැනීම සම්බන්ධයෙන් ඒජන්සිය විසින් ධාරක රටවල් සමඟ වැඩපිළිවෙලවලට ඇතුළත් වීමට ප්‍රයත්න දැරිය යුතු ය.

**19 වන ව්‍යවස්ථාව: ජාතික හා ප්‍රාදේශීය අස්තිත්වවලට සම්බන්ධතාව**

ඒජන්සියේ කටයුතුවලට සමාන කටයුතුවල නිරතව සිටින්නා වූ සාමාජික රටවලට ජාතික අස්තිත්ව සමඟ සහ ප්‍රාග්ධනයෙන් බහුතර කොටස සාමාජික රටවලට අයත්ව තිබෙන ප්‍රාදේශීය අස්තිත්ව සමඟ ඒවායේ සේවාවන්හි උපරිම කාර්යක්ෂමතාවක් ඇති කර ගැනීමේ සහ විදේශ ආයෝජන වැඩි වැඩියෙන් ගලා ඒම සම්බන්ධයෙන් ඒවායේ දායකත්වය උපරිම මට්ටමකට ගෙන ඒමේ අරමුණ ඇතිව, ඒජන්සිය විසින් ඒවා සමඟ සහයෝගයෙන් ක්‍රියා කළ යුතු අතර ඒවායේ ක්‍රියාකාරිත්වය ඌනපූරණය කිරීමට උත්සාහ කළ යුතුය. එම ප්‍රතිඵලය ඇති කර ගැනීමට, ඒජන්සිය විසින් එම සහයෝගිතාවයේ විස්තර සම්බන්ධයෙන් විශේෂයෙන් ම, ප්‍රතිරක්ෂණයේ දී සහ හවුල් රක්ෂණයේ දී බැඳීම් ඉටු කරන ආකාරය සම්බන්ධයෙන් ක්‍රියා පිළිවෙලකට ඇතුළත් විය යුතු ය.

**20 වන ව්‍යවස්ථාව : ජාතික සහ ප්‍රාදේශීය අස්තිත්වවල ප්‍රතිරක්ෂණය**

(අ) ඒජන්සියේ සාමාජිකයකු හෝ සාමාජිකයකුගේ නියෝජිතයකු හෝ ප්‍රාග්ධනයෙන් බහුතර කොටසක් සාමාජිකයින්ට අයත්ව තිබෙන ප්‍රාදේශීය ආයෝජන ඇප සහතික ආයතනයක් හෝ ප්‍රතිරක්ෂණ කර තිබෙනු වාණිජමය නොවන අවදානම් එකක් හෝ වැඩි ගණනක් හේතුවෙන් ඇති වන පාඩු සම්බන්ධයෙන් නිශ්චිත ආයෝජන වෙනුවෙන් ඒජන්සිය විසින් ප්‍රතිරක්ෂණ නිකුත් කළ හැකි ය. ප්‍රතිරක්ෂණ ගිවිසුම් වෙනුවෙන් ඒජන්සිය විසින් ආරෝපනය කර ගත හැකි අනිශ්චිත ණය තුරුස් උපරිමය මණ්ඩලය විසින් කලින් කල, විශේෂ බහුතර ඡන්දයෙන් නියම කළ යුතු ය. ප්‍රතිරක්ෂණය සඳහා ඒජන්සියට ඉල්ලුම් පත්‍රය ලැබීමට මාස දොළහකට වැඩි කාලයකට පෙර සම්පූර්ණ කර තිබෙන නිශ්චිත ආයෝජන සම්බන්ධයෙන්, ආරම්භ වශයෙන් උපරිම ප්‍රමාණය, මේ පරිච්ඡේදය යටතේ ඒජන්සියේ මුළු අනිශ්චිත ණය තුරුස් ප්‍රමාණයෙන් සියයට දහයක් ලෙස නියම කළ යුතු ය. ප්‍රතිරක්ෂණය සඳහා ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කිරීමෙන් පසුව ප්‍රතිරක්ෂිත ආයෝජන ක්‍රියාත්මක නොකළ යුතු විම හැර, ප්‍රතිරක්ෂණ කටයුතුවලට 11 සිට 14 දක්වා වන ව්‍යවස්ථාවල නිශ්චය කොට දැක්වෙන පුදුසුකම් ලැබීමේ කොන්දේසි අදාල විය යුතු ය.

(ආ) ඒජන්සියේ සහ ප්‍රතිරක්ෂිත සාමාජිකයකු හෝ ආයතනයක හෝ අතර අන්‍යෝන්‍ය අයිතිවාසිකම් සහ බැඳීම්, මණ්ඩලය විසින් නිකුත් කරනු ලැබිය හැකි රීති හා නියෝග අනුව ඒවාට යටත්ව, ප්‍රතිරක්ෂණ ගිවිසුමෙහි සඳහන් කළ යුතු ය. ඒජන්සියට ප්‍රතිරක්ෂණය සඳහා ඉල්ලුම් පත්‍රය ලැබීමට පෙරාතුව කරන ලද ආයෝජන ආවරණය වන එක් එක් ප්‍රතිරක්ෂණ ගිවිසුම, අවදානමට සරිලන වාරික, ඒජන්සියට ලැබෙන ධව සහතික කර ගනිමින් සහ ප්‍රතිරක්ෂිත අස්තිත්වය සංවර්ධනය වන සාමාජික රටවල ආයෝජන ප්‍රවර්ධනය කිරීම අරභයා නිසි කැපවීමක් ඇතිව සිටින බව සහතික කර ගනිමින්, අවදානම අවම මට්ටමකට ගෙන ඒමේ අරමුණින්, මණ්ඩලය විසින් අනුමත කළ යුතු ය.

(ඇ) ඒජන්සිය මුල් ඇප සහතිකකරු වී නම් ඒජන්සිය තිබිය හැකි වූ පුනරුද්ශන සහ බේරුම් කිරීමේ අයිතිවාසිකම් ප්‍රතිරක්ෂිත අස්තිත්වයට හෝ ඒජන්සියට තිබෙන බවට, හැකිතාක් දුරට වග බලා ගත යුතු ය. ඒජන්සිය විසින් ගෙවීමක් කිරීමට පෙර 17 වන ව්‍යවස්ථාවට අනුකූලව පරිපාලනමය ප්‍රතිකර්ම ලබා ගැනීමට යත්න දැරිය යුතු බව, ප්‍රතිරක්ෂණ නියමයන්හි සහ කොන්දේසිවල නියමිතව තිබිය යුතු ය. අදාල ධාරක රට සම්බන්ධයෙන් පුනරුද්දේශය ක්‍රියාත්මක වන්නේ ඒජන්සිය විසින් ප්‍රතිරක්ෂණය අනුමත කරනු ලැබීමෙන් පසුව පමණකි. ප්‍රතිරක්ෂිත ආයෝජනය හා සම්බන්ධ අයිතිවාසිකම් හෝ හිමිකම් පෑම් පිළිබඳව ප්‍රතිරක්ෂිතයා විසින් නිසි උද්යෝගයෙන් ක්‍රියා කළ යුතු බව නියම කෙරෙන විධිවිධාන, ඒජන්සිය විසින් ප්‍රතිරක්ෂණ ගිවිසුමෙහි ඇතුලත් කළ යුතු ය.

**21 වන ව්‍යවස්ථාව : පෞද්ගලික රක්ෂකයන් සමග සහ ප්‍රතිරක්ෂකයන් සමග සහයෝගිතාව**

(අ) ඒජන්සිය විසින් ස්වකීය කටයුතුවල වර්ධනයක් ඇති කර ගැනීම පිණිස සහ සංවර්ධනය වන සාමාජික රටවල වාණිජමය නොවන අවදානම් සඳහා ඒජන්සිය විසින් අදාල කර ගන්නා කොන්දේසිවලට සමාන කොන්දේසි මත ආවරණය සැපයීමට පෞද්ගලික රක්ෂකයන් දිරි ගැන්වීම පිණිස, ඒජන්සිය විසින් සාමාජික රටවල පෞද්ගලික රක්ෂකයන් සමග වැඩ පිළිවෙලවලට ඇතුලත් විය හැකිය. එවැනි වැඩපිළිවෙලවලට 20 වන ව්‍යවස්ථාවේ නිශ්චය කොට දක්වා ඇති කොන්දේසි හා ක්‍රියා පටිපාටි යටතේ ඒජන්සිය විසින් ප්‍රතිරක්ෂණය සැපයීම ද ඇතුලත් විය හැකිය.

(ආ) ඒජන්සිය විසින් නිකුත් කරන ලද යම් ඇප සහතිකයක් හෝ ඇප සහතික කවර හෝ නිසි ප්‍රතිරක්ෂණ අස්තිත්වයක සම්පූර්ණයෙන් ම හෝ කොටසක් හෝ ප්‍රතිරක්ෂණය කළ හැකිය.

(ඇ) පෞද්ගලික රක්ෂකයන් සහ ප්‍රතිරක්ෂකයන්ගෙන් සාධාරණ නියමයන් මත තුලනීය ආවරණයක් ලබා ගත නොහැකි ආයෝජන සඳහා ඇප සහතික දීමට ඒජන්සිය විශේෂයෙන් ප්‍රයත්න දරනවා ඇත.

22 වන ව්‍යවස්ථාව : ඇප සහතිකවල සීමාවන්

(අ) සභාව විසින් විශේෂ බහුතර ඡන්දයෙන් අන්‍යාකාරව තීරණය කළහොත් මිස, ඒජන්සිය විසින් මේ පරිච්ඡේදය යටතේ ආරෝපනය කර ගත හැකි අවිනිශ්චිත ණයතුරුස් ප්‍රමාණය, ඒජන්සියේ අවල සහභාග ප්‍රාග්ධනයේ සහ සංචිතවල ද මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි එහි ප්‍රතිරක්ෂණ ආවරණයේ කිසියම් කොටසක ද ප්‍රමාණයෙන් සියයට එකසිය පණහක් නොඉක්මවිය යුතු ය. අවිනිශ්චිත ණයතුරුස් ප්‍රමාණයේ එකතුවෙහි උපරිමයේ වෙනසක් නිර්දේශ කළ අවදානම් මට්ටම මණ්ඩලය විසින් හිමිකම් පෑම් අවදානමෙහි තරාතිරම, විවිධාංගීකරණය, ප්‍රතිරක්ෂණ ආවරණය සහ වෙනත් අදාළ සාධක සම්බන්ධයෙන් ඇති දැයි නිශ්චය කර ගැනීමේ අරමුණ ඇතිව, ඒජන්සියේ කාර්ය භාරයෙහි ඇති අත්දැකීම් ආශ්‍රයෙන්, කලින් කල සමාලෝචනය කළ යුතු ය. සභාව විසින් නිශ්චය කරන උපරිම ප්‍රමාණය කවර අවස්ථාගත තත්ත්වයක් යටතේ වුවද, ඒජන්සියේ අවල සහභාගත ප්‍රාග්ධනයේ, එහි සංචිතයේ සහ සුදුසුයැයි සැලකෙන එහි ප්‍රතිරක්ෂණ ආවරණයේ කිසියම් කොටසක ප්‍රමාණය මෙන් පස් ගුණයක් නොඉක්මවිය යුතු ය.

(ආ) ඉහත (අ) වගන්තියේ සඳහන් ඇපවීමේ සාමාන්‍ය සීමාවට හානියක් නොමැතිව, මණ්ඩලය විසින්,—

(i) එක් එක් සාමාජික රටෙහි ආයෝජකයන්ට නිකුත් කර ඇති සියළු ඇප සහතික සඳහා මේ පරිච්ඡේදය යටතේ ඒජන්සිය විසින් ආරෝපනය කර ගත හැකි අනිශ්චිත ණයතුරුස් ප්‍රමාණවල උපරිම එකතුව නියම කළ හැකිය. එම උපරිම ප්‍රමාණයන් නිශ්චය කිරීමේදී ඒජන්සියේ ප්‍රාග්ධනයෙහි ඒ ඒ සාමාජිකයා දරන කොටස ගැන සහ සංවර්ධනය වන සාමාජික රටවලින් ආරම්භ වන ආයෝජන සම්බන්ධව වඩාත් නොමසුරු සීමා අදාළ කර ගැනීමේ අවශ්‍යතාව ගැන නිසි සැලකිල්ල යොමු කළ යුතු ය ; තවද

(ii) තනි ව්‍යාපෘති, තනි ධාරක රටවල් සහ ආයෝජනයේ හෝ අවදානමේ ස්වභාවය වැනි අවදානම් විවිධාංගීකරණ සාධක සම්බන්ධයෙන් ඒජන්සිය විසින් ආරෝපනය කර ගත හැකි අනිශ්චිත ණයතුරුස් ප්‍රමාණයෙහි උපරිම එකතුව නියම කළ හැකිය.

23 වන ව්‍යවස්ථාව : ආයෝජන ප්‍රවර්ධනය

(අ) සංවර්ධනය වන සාමාජික රටවලට විදේශ ආයෝජන ගලා ඒම සඳහා වාතාවරණය වැඩි දියුණු කිරීමේ අරමුණ ඇතිව, ඒජන්සිය විසින් පර්යේෂණ කටයුතු කිරීම, ආයෝජන ගලා ඒම, ප්‍රවර්ධනය කිරීම පිණිස ක්‍රියා කිරීම සහ සංවර්ධනය වන සාමාජික රටවල ඇති ආයෝජන ඉඩ ප්‍රස්ථා පිළිබඳව තොරතුරු ප්‍රචාරය කිරීම කළ යුතු ය. සාමාජික රටක ඉල්ලීම මත එම රටෙහි දේශ සීමා ඇතුළත ආයෝජන තත්ත්වයන් වැඩි දියුණු කිරීම පිණිස, ඒජන්සිය විසින් ශිල්පීය උපදෙස් හා සහාය දිය හැකි ය. මේ කටයුතු ඉටු කිරීමේ දී, ඒජන්සිය—

(i) සාමාජික රටවල් අතර ඇති අදාළ ආයෝජන ගිවිසුම්වල මාර්ගෝපදේශ කත්වය ලබා ගත යුතු ය.

(ii) සංවර්ධනය වන සාමාජික රටවලට ආයෝජන ගලා ඒම සම්බන්ධව සංවර්ධිත සහ සංවර්ධනය වන සාමාජික රටවල ඇති බාධක ඉවත් කිරීමට උත්සාහ කළ යුතු ය.

(iii) විදේශ ආයෝජන ප්‍රවර්ධනය කිරීම හා සම්බන්ධ වෙනත් ආයතන සමඟ, විශේෂයෙන්ම ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාව සමඟ සම්බන්ධීකරණයක් පවත්වා ගත යුතු ය.

(ආ) තවද ඒජන්සිය විසින්—

(i) ආයෝජකයන් සහ ධාරක රටවල් අතර මතභේද සාමකාමී ව නිරාකරණය කර ගැනීමට උනන්දු කරවිය යුතු ය;

(ii) සංවර්ධනය වන සාමාජික රටවල් සමග, විශේෂයෙන් ම ධාරක රටවල් විමටත් ඉඩ ඇති රටවල් සමග යටත් පිරිසෙයින්, අදාළ සාමාජිකයා විසින් ම කැමැත්තක් දක්වන ආයෝජන ඇප සහතික ආයතනය හෝ රාජ්‍යය, සඳහා ආයෝජන සම්බන්ධව වූ ගිවිසුමක එකඟ වී තිබෙන සැලකිල්ල හා සමාන වාසි දායක සැලකිල්ලක්, ඒජන්සිය ඇප වී ඇති ආයෝජන සම්බන්ධයෙන් සහතික කෙරෙන ගිවිසුම් ඇති කර ගැනීමට ප්‍රයත්න දැරිය යුතු ය; මණ්ඩලයේ විශේෂ බහුතර ඡන්දයෙන්, ඒ ගිවිසුම් අනුමත කරනු ලැබිය යුතු ය;

(iii) ආයෝජන ප්‍රවර්ධනය හා ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් සාමාජිකයන් අතර ගිවිසුම් ඇති කර ගැනීම උනන්දු කරවිය යුතුය; ඒ සඳහා පහසු කම් සැලසිය යුතු ය.

(ඇ) සංවර්ධනය වන සාමාජික රටවල් අතර ආයෝජන ගලා ඒම වැඩි කිරීමේ වැදගත්කම කෙරෙහි ඒජන්සිය ස්වකීය ප්‍රවර්ධන ප්‍රයත්නයේ දී විශේෂ අවධානයක් යොමු කළ යුතු ය.

24 වන ව්‍යවස්ථාව : සමානුග්‍රහණ ආයෝජන සඳහා ඇපවීම

ඒජන්සිය විසින් මේ පරිච්ඡේදය යටතේ භාරගනු ලබන ඇප සහතික කිරීමේ කටයුතුවලට අතිරේකව, මෙ සම්මුතියේ 1 වන පරිශිෂ්ඨයෙහි විධිවිධාන සලසා ඇති සමානුග්‍රහණ ක්‍රියා පිළිවෙල යටතේ ආයෝජන වෙනුවෙන් ද ඒජන්සිය විසින් ඇප විය හැකි ය.

## IV වන පරිච්ඡේදය

## මූල්‍ය විධිවිධාන

**25 වන ව්‍යවස්ථාව : මූල්‍ය කළමනාකරණය**

ඒජන්සිය, සියලු අවස්ථාගත තත්ත්වයන් යටතේ ස්වකීය මූල්‍ය වගකීම් ඉටු කිරීමේ හැකියාව රැක ගැනීමේ අරමුණ ඇතිව උචිත ව්‍යාපාර කළමනාකරණ පරිචයට සහ දූරදර්ශී මූල්‍ය කළමනාකරණ පරිචයට අනුකූලව ස්වකීය කටයුතු කර ගෙන යා යුතු ය.

**26 වන ව්‍යවස්ථාව : වාරික සහ ගාස්තු**

එක් එක් ආකාරයේ අවදානම් සම්බන්ධයෙන් අදාළ වන වාරික අනුප්‍රමාණ, ගාස්තු සහ වෙනත් අයකිරීම් ඇතොත් ඒවා ද ඒජන්සිය විසින් නියම කොට වරින් වර සමාලෝචනය කළ යුතු ය.

**27 වන ව්‍යවස්ථාව : ශුද්ධ ආදායම් විභාජනය**

(අ) 10 වන ව්‍යවස්ථාවේ (අ) (iii) වගන්තියේ විධිවිධානවලට හානියක් නොමැතිව, සංචිතවල ප්‍රමාණය ඒජන්සිය සහභාග ප්‍රාග්ධනය මෙන් පස්ගුණයක් වනතෙක් ශුද්ධ ආදායම, ඒජන්සිය විසින් සංචිතවලට විභාජනය කළ යුතු ය.

(ආ) ඒජන්සිය, සංචිත (අ) උප වගන්තියේ නියමිත මට්ටමට පැමිණි පසුව, ඒජන්සියේ ශුද්ධ ආදායම් සංචිතවලට විභාජනය කළ යුතුද ඒජන්සියේ සාමාජිකයන් අතර බෙදා හැරිය යුතුද නැතහොත් අන්‍යාකාරයකින් යොදා ගත යුතු ද යන වග සහ එසේ කළ යුත්තේ කිනම් ප්‍රමාණයකට ද යන වග පාලක සභාව විසින් තීරණය කළ යුතු ය. ඒජන්සියේ ශුද්ධ ආදායම ඒජන්සියේ සාමාජිකයන් අතර බෙදා හැරීමක්, ඒජන්සියේ ප්‍රාග්ධනයෙහි එක් එක් සාමාජිකයාගේ කොටසට ප්‍රමාණානුකූලව, විශේෂ බහුතර ඡන්දයෙන් ක්‍රියා කරන පාලක සභාවේ තීරණයකට අනුකූලව, සිදු කළ යුතු ය.

**28 වන ව්‍යවස්ථාව : අයවැය ලේඛනය**

සභාපතිවරයා විසින් ඒජන්සියේ ආදායම් සහ වියදම් පිළිබඳව වාර්ෂික අයවැය ලේඛනයක්, මණ්ඩලයේ අනුමතිය සඳහා පිළියෙල කළ යුතු ය.

**29 වන ව්‍යවස්ථාව : ගිණුම්**

ස්වාධීන විගණකවරුන් විසින් විගණනය කරනු ලැබූ ඒජන්සියේ සහ මේ සම්මුතියේ 1 වන පරිශිෂ්ඨයේ සඳහන් සමානුග්‍රහණ භාර අරමුදලේ ගිණුම් පිළිබඳ වාර්තා ඇතුළත්ව වාර්ෂික වාර්තාවක්, ඒජන්සිය විසින් පළ කළ යුතු ය. ඒජන්සිය විසින් යම් නිසි කාලයකට වරක්, එහි ක්‍රියාකාරිත්වයේ ප්‍රතිඵල පෙන්නුම් කරන එහි මුදල් තත්ත්වය පිළිබඳව සංක්ෂිප්ත ප්‍රකාශයක් සහ ලාභ අලාභ ප්‍රකාශයක් සාමාජිකයන්ට යැවිය යුතු ය.

## V වන පරිච්ඡේදය

### සංවිධානය හා කළමනාකරණය

**30 වන ව්‍යවස්ථාව :— ඒජන්සියේ ව්‍යුහය**

ඒජන්සියට පාලක සභාවක්, අධ්‍යක්ෂ මණ්ඩලයක්, සභාපතිවරයෙක් සහ ඒජන්සිය විසින් නිශ්චය කරනු ලැබිය හැකි කාර්ය ඉටු කිරීම සඳහා කාර්ය මණ්ඩලයක් ද තිබිය යුතු ය.

**31 වන ව්‍යවස්ථාව :—පාලක සභාව**

(අ) සම්මුතියේ නියමයන් අනුව ඒජන්සියේ වෙනත් යම් අනු ආයතනයක් වෙත නිශ්චිතව පවරා ඇති බලතල හැර ඒජන්සියේ සියලු බලතල සභාව වෙත පැවරෙන්නේ ය. පහත සඳහන් බලතල හැර, පාලක සභාවේ කවර හෝ බලයක්, පාලක සභාව විසින් මණ්ඩලය වෙත පවරනු ලැබිය හැකි ය.

(i) අලුත් සාමාජිකයන් ඇතුළත් කර ගැනීමේ සහ ඔවුන් ඇතුළත් කිරීමේ කොන්දේසි නිශ්චය කිරීමේ බලය ;

(ii) සාමාජිකයකුගේ සමාජිකත්වය අත්හිටුවීමේ බලය ;

(iii) ප්‍රාග්ධනයේ යම් වැඩි කිරීමක් හෝ අඩු කිරීමක් පිළිබඳව තීරණය කිරීමේ බලය ;

(iv) 22 වන ව්‍යවස්ථාවේ (අ) වගන්තිය ප්‍රකාර, අනිශ්චිත ණයතුරුස්වල මුළු ප්‍රමාණයේ සීමාව වැඩි කිරීමේ බලය ;

(v) 3 වන ව්‍යවස්ථාවේ (ඇ) වගන්තිය ප්‍රකාර යම් සමාජිකයකු සංවර්ධනය වන සාමාජික රටක් ලෙස නම් කිරීමේ බලය ;

(vi) 39 වන ව්‍යවස්ථාවේ (අ) වගන්තිය ප්‍රකාර, ඡන්දය දීමේ කාර්ය සඳහා අලුත් සාමාජිකයකු පළමු ගණයට හෝ දෙවන ගණයට ඇතුළත් වන සේ වර්ග කිරීමේ හෝ ඒ කාර්යය සඳහා ම දැනට සිටින සාමාජිකයකු නැවත වර්ග කිරීම ;

(vii) අධ්‍යක්ෂවරුන්ගේ හා ඔවුන්ගේ වෛකල්පිකයන්ගේ දීමනා නිශ්චය කිරීමේ බලය ;

(viii) ඒජන්සියේ, කටයුතු නතර කොට එය ඈවර කිරීමේ බලය ;

(ix) ඈවර කිරීමේ දී සාමාජිකයන් අතර වත්කම් බෙදා හැරීමේ බලය ; සහ

(x) මේ සම්මුතිය, එහි පරිශිෂ්ටාවලිය සහ උපලේඛන සංශෝධනය කිරීමේ බලය.

(ආ) පාලක සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි එක් එක් සාමාජික රට විසින් පත් කරන එක් පාලකවරයකුගෙන් සහ එක් වෛකල්පික පාලකවරයකුගෙන් පාලක සභාව සංයුක්ත වන්නේ ය. තමාගේ නියෝජක පැමිණ නොමැති විට හැර වෛකල්පික පාලකවරයා ඡන්දය නොදිය යුතු ය. සභාව විසින් එක් පාලකවරයකු එහි සභාපති ලෙස තෝරා ගත යුතු ය.

(ඇ) වාර්ෂික රැස්වීමක් සහ සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි හෝ මණ්ඩලය විසින් කැඳවනු ලැබිය හැකි පරිදි වූ වෙනත් රැස්වීම් ද සභාව විසින් පැවැත්විය යුතු ය. සාමාජිකයන් පස් දෙනෙකු විසින් හෝ මුළු ඡන්ද බලයෙන් සියයට විසිපහක් හිමි සාමාජිකයන් විසින් හෝ ඉල්ලා සිටිනු ලැබූ කවර අවස්ථාවක වුවද මණ්ඩලය විසින් සභාවේ රැස්වීමක් කැඳවිය යුතු ය.

**32 වන ව්‍යවස්ථාව :—මණ්ඩලය**

(අ) මණ්ඩලය, ඒජන්සියේ සාමාන්‍ය ක්‍රියාකාරීත්වය පිළිබඳව වගකිව යුතු අතර, එම වගකීම ඉටු කිරීමෙහි ලා මේ සම්මුතිය යටතේ කළ යුතු හෝ කිරීමට අවසර ඇති කවර හෝ ක්‍රියාවක් කළ යුතු ය.

(ආ) මණ්ඩලය, දොළොස් දෙනෙකුට නොඅඩු අධ්‍යක්ෂවරයන් සංඛ්‍යාවකින් සමන්විත විය යුතු ය. සාමාජිකත්වයේ ඇති වන වෙනස් වීම් සැලකිල්ලට ගනිමින් සභාව විසින් අධ්‍යක්ෂ සංඛ්‍යාව වෙනස් කරනු ලැබිය හැකි ය. එක් එක් අධ්‍යක්ෂවරයා විසින්, ඔහු නොපැමිණි අවස්ථාවක හෝ ඔහුට කටයුතු කිරීමට නොහැකි අවස්ථාවක ඔහු වෙනුවෙන් ක්‍රියා කිරීමට පූර්ණ බලය සහිත වෛකල්පික අධ්‍යක්ෂවරයකු පත් කරනු ලැබිය හැකි ය. බැංකුවේ අධිපතිවරයා නිල බලයෙන් මණ්ඩලයේ සභාපතිවරයා වන්නේ ය. එහෙත් ඡන්ද සංඛ්‍යාව සමානව ඇති අවස්ථාවක දිය හැකි තීරක ඡන්දයක් හැර එම සභාපතිවරයාට ඡන්දයක් නොමැති විය යුතු ය.

(ඇ) අධ්‍යක්ෂවරයන්ගේ ධුර කාලය, සභාව විසින් නිශ්චය කළ යුතු ය. සභාව විසින් එහි ආරම්භක රැස්වීමේ දී ප්‍රථම මණ්ඩලය සංස්ථාපනය කළ යුතු ය.

(ඈ) අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිවරයා විසින් සිය මෙහෙයවීමෙන් ම හෝ අධ්‍යක්ෂවරයන් තිදෙනෙකුගේ ඉල්ලීම මත ක්‍රියා කරමින් කැඳවනු ලැබූ විට මණ්ඩලය රැස්විය යුතු ය.

(ඉ) ඒජන්සියට අඛණ්ඩව රැස්ව ක්‍රියා කරන නිත්‍ය අධ්‍යක්ෂ මණ්ඩලයක් සිටිය යුතු යැයි සභාව විසින් තීරණය කරනු ලබන තෙක්, මණ්ඩලයේ රැස්වීම්වලට පැමිණීමේ සහ ඒජන්සිය වෙනුවෙන් වෙනත් නිල කර්තව්‍යයන් ඉටු කිරීමේ වියදම් සඳහා පමණක්, අධ්‍යක්ෂවරයන්ට හා වෛකල්පික අධ්‍යක්ෂවරයන්ට දීමනා ලැබිය යුතු ය. අඛණ්ඩව ක්‍රියා කරන මණ්ඩලයක් පිහිටුවනු ලැබූ විට, සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි පාරිශ්‍රමිකයන් අධ්‍යක්ෂවරයන්ට සහ වෛකල්පික අධ්‍යක්ෂවරයන්ට ගෙවනු ලැබිය යුතු ය.

33 වන ව්‍යවස්ථාව :—ඒජන්සියේ සභාපතිවරයා සහ කාර්ය මණ්ඩලය

(අ) ඒජන්සියේ සභාපතිවරයා විසින්, මණ්ඩලයේ සාමාන්‍ය පාලනය යටතේ ඒජන්සියේ, සාමාන්‍ය කටයුතු පවත්වාගෙන යා යුතු ය, කාර්ය මණ්ඩලය සංවිධාන කිරීම, පත් කිරීම සහ සේවයෙන් පහ කිරීම සම්බන්ධයෙන් ඔහු වගකිව යුතු ය.

(ආ) මණ්ඩලයේ සභාපතිවරයා විසින් කරනු ලබන නාමයෝජනාව මත මණ්ඩලය විසින් ඒජන්සියේ සභාපතිවරයා පත් කරනු ලැබිය යුතු ය. ඒජන්සියේ සභාපතිවරයාගේ වැටුප සහ සේවා ගිවිසුමේ නියමයන්, සභාව විසින් නිශ්චය කළ යුතු ය.

(ඇ) තම තමන්ගේ ධුරවල කටයුතු ඉටු කිරීමේ දී සභාපතිවරයා සහ කාර්ය මණ්ඩලය වෙනත් කිසිම අධිකාරයකට නොව මුළුමනින් ම ඒජන්සියට සේවය කිරීමට බැඳී සිටින්නේ ය. මෙම බැඳීමෙහි අන්තර්ජාතික ස්වරූපයට ඒජන්සියේ සෑම සාමාජිකයකුම ගරු කළ යුතු අතර, සභාපතිවරයා විසින් හෝ කාර්ය මණ්ඩලය විසින් හෝ ඔවුන්ගේ කාර්ය ඉටු කරනු ලැබීමේ දී බලපෑමක් කිරීමේ සියලු ප්‍රයත්නයන්ගෙන් වැළකිය යුතු ය.

(ඈ) කාර්ය මණ්ඩලය පත් කිරීමේ දී සභාපතිවරයා විසින්, ඉහළම කාර්යක්ෂමතා මට්ටමක් සහ ශිල්පීය ප්‍රවීණතාවක් අත් කර ගැනීමේ ප්‍රධානතම වැදගත්කමට යටත්ව භූගෝලීය වශයෙන් හැකිතාක් පුළුල් පදනමක් මත පුද්ගලයන්, බඳවා ගැනීමේ වැදගත්කම ගැන ද නිසි පරිදි සැලකිලිමත් විය යුතු ය.

(ඉ) ඒජන්සියේ කටයුතු කර ගෙන යාමේ දී ලබා ගන්නා තොරතුරු සම්බන්ධයෙන් සභාපතිවරයාගේ කාර්ය මණ්ඩලය සැමවිටම රහස්‍යභාවය පවත්වා ගත යුතු ය.

34 වන ව්‍යවස්ථාව :—දේශපාලන කටයුතු තහනම් බව

ඒජන්සිය, එහි සභාපතිවරයා සහ කාර්ය මණ්ඩලය, කවර හෝ සාමාජික රටක දේශපාලන කටයුතුවලට මැදිහත් නොවිය යුතු ය. ආයෝජනයක් සම්බන්ධ වූ සියලු අවස්ථාගත කරුණු සැලකිල්ලට ගැනීමට ඒජන්සියට ඇති අයිතිවාසිකමට හානියක් නොමැතිව, සාමාජික රටෙහි හෝ සාමාජික රටවල දේශපාලන ස්වරූපය,

ඒජන්සියේ තීරණ කෙරෙහි බල නොපෑ යුතු ය. 2 වන ව්‍යවස්ථාවේ ප්‍රකාශිත කාර්යයන් සාක්ෂාත් කර ගැනීම පිණිස, ඔවුන්ගේ තීරණවලට අදාළ ව සැල කිල්ලට ගත යුතු කරුණු අපක්ෂපාතව තුලනය කළ යුතු ය.

**35 වන ව්‍යවස්ථාව :—අන්තර්ජාතික සංවිධාන සමග සම්බන්ධතා**

ඒජන්සිය විසින් මේ සම්මුතියේ නියමයන් ඇතුළත, එක්සත් ජාතීන්ගේ ආයතනය සමග සහ අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂ වගකීම් දරන විශේෂයෙන්ම බැංකුව සහ ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාව ඇතුළුව වෙනත් ආණ්ඩු අතර සංවිධාන සමග සහයෝගයෙන් කටයුතු කළ යුතු ය.

**36 වන ව්‍යවස්ථාව :—ප්‍රධාන කාර්යාලයේ පිහිටීම**

(අ) ඒජන්සියේ ප්‍රධාන කාර්යාලය, වෙනත් ස්ථානයක පිහිටුවීමට සභාව විසින් විශේෂ බහුතර ඡන්දයෙන් තීරණය කළහොත් මිස, වොෂින්ටන් ඩී. සී. හි පිහිටුවනු ලැබිය යුතු ය.

(ආ) සභාව විසින් ස්වකීය වැඩ කටයුතු සඳහා අවශ්‍ය විය හැකි වෙනත් කාර්යාල, පිහිටුවනු ලැබිය හැකි ය.

**37 වන ව්‍යවස්ථාව :—වත්කම් තැන්පත් කරන ස්ථාන**

එක් එක් සාමාජික රටෙහි ව්‍යවහාර මුදලින් ඒජන්සිය සතු වත්කම් හෝ ඒජන්සියේ වෙනත් වත්කම් තැන්පත් කර තැබීම සඳහා ඒ ඒ සාමාජික රට විසින් ස්වකීය මහ බැංකුව නම් කළ යුතු ය, එම රටෙහි මහ බැංකුවක් නොමැති නම්, ඒ කාර්යය සඳහා ඒජන්සියට පිළිගත හැකි වෙනත් යම් ආයතනයක් එම රට විසින් නම් කළ යුතු ය.

**38 වන ව්‍යවස්ථාව :—සංනිවේදන මාර්ග**

(අ) මේ සම්මුතිය යටතේ උද්ගතවන කවර හෝ කාරණයක් සම්බන්ධයෙන් ඒජන්සිය විසින් අදහස් හුවමාරු කර ගත හැකි උචිත බලධරයකු එක් එක් සාමාජික රට විසින් නම් කළ යුතු ය. ඒ බලධරයාගේ ප්‍රකාශ, සාමාජිකයාගේ ප්‍රකාශ ලෙස සලකා ඒජන්සිය විසින් ඒවා කෙරෙහි විශ්වාසය තැබිය හැකි ය. 19 සිට 21 දක්වා වූ ව්‍යවස්ථාවල සඳහන් කර ඇති සහ ඒ සාමාජික රටෙහි අස්තිත්ව හෝ රක්ෂකයන් පිළිබඳව වන කාරණ සම්බන්ධයෙන්, සාමාජිකයකු විසින් ඉල්ලා සිටිනු ලැබූ විට, ඒජන්සිය විසින් ඒ සාමාජිකයා සමග සාකච්ඡා කළ යුතු ය.

(ආ) ඒජන්සිය විසින් කිසියම් ක්‍රියාවක් කිරීමට පෙර සාමාජිකයාගේ අනුමතිය අවශ්‍ය වන කවර අවස්ථාවක චුවිද යෝජිත ක්‍රියාව පිළිබඳව දැනුම් දීමේ දී ඒජන්සිය විසින් නියම කරනු ලැබිය හැකි යම් සාධාරණ කාල සීමාවක් ඇතුළත, ඒ සාමාජිකයා විසින් විරෝධතාවක් ඉදිරිපත් කළහොත් මිස, ඊට අනුමතිය දී ඇත්තාක් සේ සලකනු ලැබිය යුතු ය.

## VI වන පරිච්ඡේදය

### ඡන්දය දීම, සහභාගි වීම සහ නියෝජනය සැකසීම

**39 වන ව්‍යවස්ථාව :—ඡන්දය සහ සහභාගිත්වය සැකසීම**

(අ) මේ සම්මුතියේ "අ" උපලේඛනයේ ලැයිස්තු ගතකර තිබෙන රාජ්‍ය ගණ දෙකට, ඒජන්සියෙහි සමාන සම්බන්ධතා මෙන්ම එක් එක් සාමාජිකයාගේ මූල්‍ය සහභාගිත්වයේ වැදගත්කම පිළිබිඹු වන පරිදි ඡන්දය දීමේ ක්‍රියා පිළිවෙලක් සඳහා විධිවිධාන සැලසීම පිණිස එක් එක් සාමාජිකයාට, සාමාජික ඡන්ද 177 ක් සහ ඊට එකතුව ඒ සාමාජිකයා උසුලන එක් එක් ස්කන්ධ කොටස වෙනුවෙන් එක් සහභාගිත්ව ඡන්දයක් ද තිබිය යුතු ය.

(ආ) මේ සම්මුතිය බලාත්මක වී අවුරුදු තුනක් ඇතුළත කවර හෝ අවස්ථාවක මේ සම්මුතියේ "අ" උපලේඛනයේ ලැයිස්තු ගත රාජ්‍ය ගණ දෙකෙන් කවර හෝ එක් ගණයකට අයත් සාමාජිකයන්ගේ සාමාජික ඡන්ද සහ සහභාගිත්ව ඡන්දවල එකතුව, සමස්ත ඡන්ද බලයෙන් සියයට හතලිහකට අඩු වන්නේ නම්, ඒ ගණයේ මුළු ඡන්ද බලය ; සමස්ත ඡන්ද බලයෙහි එවැනි ප්‍රතිශතයකට සම කිරීම සඳහා අවශ්‍ය විය හැකි පරිපූරක ඡන්ද සංඛ්‍යාවක් හිමි වන්නේ ය. ඒ පරිපූරක ඡන්ද ගණයේ එක් එක් සාමාජිකයාගේ සහභාගිත්ව ඡන්ද සහ ඒ ගණයේ මුළු සහභාගිත්ව ඡන්ද සංඛ්‍යාව අතර ඇති අනුපාතය අනුව ඒ ගණයේ සාමාජිකයන් අතර බෙදා හැරිය යුතු ය. ඒ පරිපූරක ඡන්ද, ඒ ප්‍රතිශතය පවත්වා ගෙන යන බවට වග බලා ගැනීම පිණිස අවශ්‍ය නිරායාස සැකසීම්වලට යටත් වන අතර, ඉහත සඳහන් තුන් අවුරුදු කාල සීමාව අවසානයේ දී අවලංගු කරනු ලබන්නේ ය.

(ඇ) මේ සම්මුතිය බලාත්මක වීමෙන් පසුව එන තුන්වන අවුරුද්ද තුළ, කොටස් වෙන් කර දී ඇති ආකාරය සභාව විසින් සමාලෝචනය කළ යුතු අතර එම තීරණවලට එළඹීමේ දී මෙහි පහත දැක්වෙන මූලධර්ම මාර්ගෝපදේශක කර ගත යුතු ය :—

(i) සාමාජික රටවල ඡන්දවලින් ඒජන්සියේ ප්‍රාග්ධනයට නියම වශයෙන් සහභාගි වී ඇති ප්‍රමාණය සහ මේ ව්‍යවස්ථාවේ (අ) වගන්තියේ ගෙන හැර දක්වා ඇති පරිදි සාමාජික ඡන්ද පිළිබිඹු විය යුතු ය.

(ii) සම්මුතියට අත්සන් කර නොමැති රටවලට වෙන් කර දී ඇති කොටස් ඉහත සඳහන් ගණ අතර ඡන්දවල සමතාවක් ඇති කළ හැකි වන පරිදි එවැනි යම් සාමාජිකයන්ට හා එවැනි යම් ආකාරයකට නැවත වෙන් කර දීම පිණිස ඉදිරිපත් කළ යුතු ය.

(iii) සාමාජිකයන්ට වෙන් කර දෙන කොටස් සඳහා සහභාගි වීමට සාමාජිකයන්ට ඇති ශක්තිය සඳහා පහසුකම් සලසන ක්‍රියා මාර්ග, සභාව විසින් ගත යුතු ය.

(ඈ) මේ ව්‍යවස්ථාවේ (ආ) වගන්තියේ විධිවිධාන සලසා ඇති තුන් අවුරුදු කාල සීමාව ඇතුළත, මේ සම්මුතිය යටතේ විශේෂ ඉහළ බහුතරයක් අවශ්‍යව ඇති තීරණ ඒ ඉහළ බහුතර ඡන්දයෙන් ගත යුතු වීම හැර, පාලක සභාවේ සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ සියලු තීරණ, විශේෂ බහුතර ඡන්දයෙන් ගත යුතු ය.

(ඉ) 5 වන ව්‍යවස්ථාවේ (ඇ) වගන්තිය ප්‍රකාර ඒජන්සියේ ප්‍රාග්ධන ස්කන්ධ වැඩි කරනු ලැබූ විටක, සහභාගි වීම සඳහා ඉල්ලීමක් කරන එක් එක් සාමාජික රටට, ඊට ඉහතින් එය දායක වී ඇති ස්කන්ධ ප්‍රමාණය, ඒජන්සියේ මුළු ප්‍රාග්ධන ස්කන්ධවලට දරන අනුපාතයට සමානුපාතික වන එම වැඩි කළ ප්‍රාග්ධනයෙන් කොටසකට සහභාගි වීමට, බලය දිය යුතු ය ; එහෙත් වැඩි කළ ප්‍රාග්ධනයේ කිසියම් කොටසකට දායක වීමට කිසි සාමාජික රටක් බැඳීමක් නොවිය යුතු ය.

(ඊ) මේ ව්‍යවස්ථාවේ (ඉ) වගන්තිය යටතේ අතිරේක සහභාගිවීම් සම්බන්ධයෙන් පාලක සභාව විසින් නියෝග නිකුත් කරනු ලැබිය යුතු ය. සාමාජිකයන් විසින් එවැනි සහභාගිවීම් සඳහා වන ඉල්ලීම් ඉදිරිපත් කළ හැකි සාධාරණ කාල සීමාවන් ඒ නියෝගවලින් නියම කරනු ලැබිය යුතු ය.

**40 වන ව්‍යවස්ථාව: සභාවේ ඡන්දය දීම**

(අ) එක් එක් පාලකවරයාට ඔහු නියෝජනය කරන සාමාජිකයාගේ ඡන්ද පාවිච්චි කිරීමට හිමිකම් තිබිය යුතු ය. මේ සම්මුතියේ අන්‍යාකාරව නිශ්චිතව දක්වා ඇති අවස්ථාවන්හි හැර, පාලක සභාවේ තීරණ, දෙන ලද ඡන්ද සංඛ්‍යාවේ බහුතරය අනුව ගත යුතු ය.

(ආ) සභාවේ කවර හෝ රැස්වීමක් සඳහා ගණපූරණය, සමස්ත ඡන්ද බලයෙන් තුනෙන් දෙකකට නොඅඩු ප්‍රමාණයක් පාවිච්චි කරන පාලකවරයන්ගේ බහුතරයකින් සංයුක්ත විය යුතු ය.

(ඇ) කිසියම් නිශ්චිත ප්‍රශ්නයක් පිළිබඳව සභාවේ රැස්වීමක් නොකැඳවා තීරණය කට එළඹීම, ඒජන්සියේ උපරිම යහපත පිණිස වන බව මණ්ඩලය සලකන අවස්ථාවක, මණ්ඩලය විසින් එසේ ඉල්ලා සිටිය හැකි වන පරිදි, සභාව විසින් නියෝග මඟින් කාර්ය පටිපාටියක් ස්ථාපනය කළ හැකි ය.

**41 වන ව්‍යවස්ථාව: අධ්‍යක්ෂවරයන් තෝරා පත් කර ගැනීම**

(අ) අධ්‍යක්ෂවරයන් "ආ" උපලේඛනයට අනුකූලව තෝරා පත් කර ගත යුතු ය.

(ආ) ස්වකීය අනුප්‍රාප්තිකයන් තෝරා පත් කර ගන්නා තෙක් අධ්‍යක්ෂවරයන් තම ධුරයෙහි නොකඩව කටයුතු කළ යුතු ය. අධ්‍යක්ෂවරයකුගේ ධුර කාලය අවසන් වීමට පෙර, දින අනූවකට වැඩි කාලයක් ඔහුගේ ධුරය හිස් ව තිබුණහොත් කලින් සිටි අධ්‍යක්ෂවරයා තෝරා පත් කර ගනු ලැබූ පාලකවරයන් විසින්, ඒ ධුර කාල යෙන් ඉතිරි කොටස සඳහා වෙනත් අධ්‍යක්ෂවරයකු තෝරා පත් කර ගත යුතු ය. තෝරා පත් කර ගැනීම සඳහා, දෙනු ලැබූ ඡන්ද සංඛ්‍යාවෙන් බහුතර ඡන්දයක් අවශ්‍ය වන්නේ ය. ධුරය හිස්ව පවත්නා අතරතුර, කලින් සිටි අධ්‍යක්ෂවරයාගේ විකල්ප අධ්‍යක්ෂවරයා විසින් විකල්පයක් පත් කිරීමේ බලය හැර, ඔහුගේ බලතල ක්‍රියාත්මක කළ යුතු ය.

**42 වන ව්‍යවස්ථාව: මණ්ඩලයේ දී ඡන්දය දීම**

(අ) අධ්‍යක්ෂවරයකු තෝරා පත් කර ගැනීම උදෙසා ගණන් කරනු ලැබුවේ යම් සාමාජිකයන්ගේ ඡන්ද සංඛ්‍යාවක් ද, ඒ ඡන්ද සංඛ්‍යාව දීමට එක් එක් අධ්‍යක්ෂ වරයාට හිමිකම් ඇත්තේ ය. අධ්‍යක්ෂවරයකු විසින් දෙනු ලැබීමට හිමිකම ඇති සියලු ඡන්ද එක් ඒකකයක් වශයෙන් දෙනු ලැබිය යුතු ය. මේ සම්මුතියෙහි අන්‍යාකාරයකින් නියම කොට ඇති විට හැර, දෙනු ලැබූ ඡන්ද සංඛ්‍යාවේ බහුතරයකින් මණ්ඩලයේ තීරණ ගත යුතු ය.

(ආ) ඡන්දය දීමේ සම්පූර්ණ බලයෙන් අඩකට අඩු නොවන, ඡන්ද බලය ක්‍රියාත්මක කරන අධ්‍යක්ෂවරයන්ගේ බහුතරයකින් මණ්ඩලයේ රැස්වීමක ගණපූරණය සංයුක්ත විය යුතු ය.

(ඇ) යම් ක්‍රියාවක් ඒජන්සියේ උපරිම යහපත සඳහා වන්නේ යයි මණ්ඩලයේ සභාපතිවරයා විසින් සලකනු ලබන අවස්ථාවක, ඔහු විසින් මණ්ඩලයේ රැස්වීමක් නොකැඳවා, නිශ්චිත ප්‍රශ්නයක් පිළිබඳව මණ්ඩලයේ තීරණයක් ඉල්ලා සිටිනු ලැබිය හැකි කාර්ය පටිපාටියක්, මණ්ඩලය විසින්, නියෝග මඟින් ඇති කරනු ලැබිය හැකි ය.

## VII වන පරිච්ඡේදය

### වරප්‍රසාද සහ නිදහස් කිරීම්

**43 වන ව්‍යවස්ථාව : පරිච්ඡේදයේ පරමාර්ථ**

ස්වකීය කර්තව්‍ය මුදුන්පත් කර ගැනීමට ඒජන්සියට හැකි කරනු පිණිස, එක් එක් සාමාජිකයාගේ භූ ප්‍රදේශයෙහි ඇති ඒජන්සියට මේ පරිච්ඡේදයෙහි දක්වා ඇති නිදහස් කිරීම් සහ වරප්‍රසාද ප්‍රදානය කරනු ලැබිය යුතු ය.

**44 වන ව්‍යවස්ථාව : නෛතික කාර්යාවලිය**

ඒජන්සියට කාර්යාලයක් ඇත්තා වූ හෝ කාර්යාවලිය පිළිබඳ දැන්වීම් භාර ගැනීමේ හෝ භාර දීමේ කාර්ය සඳහා අනුයෝජිතයකු වශයෙන් පත් කරනු ලැබ ඇත්තා වූ සාමාජිකයන්ගේ භූ ප්‍රදේශයන්හි නිසි අධිකරණ බලය ඇති අධිකරණයක දී පමණක් 57 වන සහ 58 වන ව්‍යවස්ථාවල විෂය ප්‍රමාණය ඇතුළත නොවන නඩු ඒජන්සියට විරුද්ධව පවරනු ලැබිය හැකි ය.

(i) සාමාජිකයන් විසින් හෝ සාමාජිකයන් වෙනුවෙන් ක්‍රියා කරන්නා වූ හෝ හිමිකම් පෑම් ව්‍යුත්පන්න වූ තැනැත්තන් විසින් ; හෝ

(ii) පෞද්ගලික කාරණා සම්බන්ධයෙන් හෝ එවැනි කිසිම නඩුවක් ඒජන්සියට විරුද්ධව පවරනු නොලැබිය යුතු ය. ඒජන්සියේ දේපළ සහ වත්කම් කවර හෝ ස්ථානයක පිහිටිය ද, කවරකු විසින් හෝ දරනු ලැබුව ද, ඒජන්සියට විරුද්ධව අවසාන නඩු තීන්දුව හෝ ප්‍රදානය භාරදීමට පෙර සියලු ආකාරයෙන් වූ තහනමට ගැනීමෙන්, තහනම් කිරීමෙන් හෝ ක්‍රියාවේ යෙදවීමෙන් නිදහස් වන්නේ ය.

**45 වන ව්‍යවස්ථාව : වත්කම්**

(අ) ඒජන්සියේ දේපළ සහ වත්කම් කවර හෝ ස්ථානයක පිහිටිය ද කවරකු විසින් හෝ දරනු ලැබුව ද, විධායක හෝ ව්‍යවස්ථාදායක ක්‍රියාවක් මඟින් සෝදිසි කිරීමෙන්, බල කර ලබා ගැනීමෙන්, රාජ්‍ය සතු කිරීමෙන්, සන්තකය පැහැර ගැනීමෙන් හෝ වෙනත් යම් ආකාරයක තහනමට ගැනීමෙන් නිදහස් වන්නේ ය.

(ආ) මේ සම්මුතිය යටතේ ස්වකීය ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ප්‍රමාණයට ඒජන්සියේ සියලු දේපළ සහ වත්කම් කවර හෝ ස්වභාවයකින් වූ පරිසීමා කිරීම්වලින්, විධිමත් කිරීම්වලින්, පාලන කිරීම්වලින් සහ දේපළ පැවරීම තාවකාලිකව අත්හිටුවීමෙන් නිදහස් වන්නේ ය. එසේ වුවද ඇප සහතිකයක් ප්‍රතිරක්ෂිත අස්තිත්වයක් දරන්නකුගේ අනුප්‍රාප්තිකයකු වශයෙන් හෝ පුනරාදේශකයකු වශයෙන් හෝ ප්‍රතිරක්ෂිත අස්තිත්වයකින් රක්ෂිත ආයෝජකයකු වශයෙන් හෝ ඒජන්සිය විසින් අත් කර ගනු ලැබූ දේපළ සහ වත්කම්, ඒ ඒජන්සිය පුනරාදේශකයකු කරනු ලැබුවේ යම් දරන්නකුට ද, අස්තිත්වයකුට ද නැතහොත් ආයෝජකයකුට ද, ඒ දරන්නා, අස්තිත්වය නැතහොත් ආයෝජක ඒ ප්‍රතිකර්මය ලැබීමට හිමිකම් ඇති ප්‍රමාණයට අදාළ සාමාජිකයාගේ භූ ප්‍රදේශයන්හි භාවිත වන විදේශ විනිමය පරිසීමා කිරීම් වලින්, නියෝගවලින් සහ බලපවත්නා පාලන ක්‍රමවලින් නිදහස් විය යුතු ය.

(ඇ) මේ පරිච්ඡේදයේ කාර්ය සඳහා "වත්කම්" යන යෙදුමෙහි මේ සම්මුතියෙහි I වන උපලේඛනයෙහි සඳහන් සමානුග්‍රහ භාර අරමුදලේ වත්කම් සහ ස්වකීය අරමුණු නංවාලීමෙහි ලා ඒජන්සිය විසින් පරිපාලනය කරනු ලබන වෙනත් වත්කම් ඇතුළත් වන්නේ ය.

**46 වන ව්‍යවස්ථාව : ලේඛනාගාරය සහ පණිවුඩ සේවය**

(අ) කවර හෝ ස්ථානයක තිබුණ ද ඒජන්සියේ ලේඛනාගාර අලංඝනීය වේ.

(ආ) එක් එක් සාමාජිකයා විසින් බැංකුවේ නිල පණිවුඩවලට දෙනු ලබන සැලකිල්ලම ඒජන්සියේ නිල පණිවුඩවලට ද දෙනු ලැබිය යුතු ය.

**47 වන ව්‍යවස්ථාව : බදු**

(අ) ඒජන්සිය, එහි වත්කම්, දේපළ හා ආදායම සහ මේ සම්මුතියෙන් බලය දෙනු ලැබූ එහි ක්‍රියා කාරකම් හා ගනුදෙනු සියලු බදුවලින් සහ තීරු බදුවලින් නිදහස් වන්නේ ය. යම් බද්දක් හෝ තීරු බද්දක් එකතු කිරීම හෝ ගෙවීම සඳහා වූ වගකීමෙන් ද ඒජන්සිය නිදහස් විය යුතු ය.

(ආ) ස්වදේශිකයන් සම්බන්ධයෙන් වන විට හැර, ඒජන්සිය විසින් පාලකවරයන්ට සහ ඔවුන්ගේ වෛකල්පිකයන්ට, ගෙවනු ලබන වියදම් දීමනා මත හෝ ඒ සම්බන්ධයෙන් හෝ ඒජන්සිය විසින් මණ්ඩලයේ සභාපතිවරයාට, අධ්‍යක්ෂවරයන්ට, ඔවුන්ගේ වෛකල්පිකයන්ට, සභාපතිවරයාට හෝ ඒජන්සියේ කාර්ය මණ්ඩලයට ගෙවනු ලබන වැටුප්, වියදම් දීමනා හෝ වෙනත් පඩිනඩි මත හෝ ඒ සම්බන්ධයෙන් කිසිම බද්දක් අය නොකළ යුතු ය.

(ඇ) කවරකු විසින් දරනු ලැබුව ද, (සහතික කරනු ලැබූ හෝ ප්‍රතිරක්ෂණය කරනු ලැබූ යම් ආයෝජනයකින් ලබන ඉපැයීම් කිසිවක් ඇතුළුව) සහතික කරනු ලැබූ හෝ ප්‍රතිරක්ෂණය කරනු ලැබූ යම් ආයෝජනයක් මත හෝ (ඒජන්සිය විසින් ප්‍රතිරක්ෂණය කරනු ලැබූ රක්ෂණ ඔප්පු කිසිවකින් ලබන යම් වාරික සහ වෙනත් ආදායම් ඇතුළුව) ඒජන්සිය විසින් ප්‍රතිරක්ෂණය කරනු ලැබූ රක්ෂණ ඔප්පු කිසිවක් මත,—

(i) ඒජන්සිය විසින් ඒ ආයෝජනය හෝ රක්ෂණ ඔප්පුව සහතික කරනු ලැබූ නිසා ම නැතහොත් ප්‍රතිරක්ෂණය කරනු ලැබූ නිසා ම, ඒ ආයෝජනයට හෝ රක්ෂණ ඔප්පුවට ප්‍රතිපක්ෂව විශේෂත්වයක් දක්වන්නා වූ; හෝ

(ii) ඒ බදු පැනවීම සඳහා එකම අධිකරණ බලසීමා පදනම ඒජන්සිය විසින් පවත්වා ගෙන යනු ලබන යම් කාර්යාලයක හෝ ව්‍යාපාර ස්ථානයක පිහිටීම වන්නේ නම්, ඒ මත කවර හෝ වර්ගයකට අයත් බද්දක් අය නොකළ යුතු ය.

**48 වන ව්‍යවස්ථාව : ඒජන්සියේ නිලධරයන්**

ඒජන්සියේ සියලු පාලකවරයන්, අධ්‍යක්ෂවරයන්, වෛකල්පිකයන්, සභාපතිවරයා සහ කාර්ය මණ්ඩලය,—

(i) ඔවුන් විසින් තම නිල තත්ත්වයෙන් ඉටු කරන ලද ක්‍රියා සම්බන්ධයෙන් නෛතික කාර්යාවලියට භාජනය කරනු ලැබීමෙන් නිදහස් වන්නේ ය;

(ii) ස්වදේශිකයන් නොවන්නේ නම්, වෙනත් සාමාජික රටවල සමාන නිලයක් දරන නියෝජිතයන්ට, නිලධරයන්ට සහ සේවා නියුක්තයන්ට අදාළව පිරිනමනු ලබන ආගමන පරිසීමා කිරීම්වලින් විදේශිකයන් ලියාපදිංචි කිරීමේ නියමයන්ගෙන් සහ ජාතික සේවා බැඳීම්වලින් නිදහස් කිරීමේ පරිහාරය සහ විදේශ විනිමය පරිසීමා කිරීම සම්බන්ධයෙන් ඒ පහසුකම්වලින් ප්‍රදානය කළ යුතු ය; තවද,

(iii) වෙනත් සාමාජික රටවල සමාන නිලයක් දරන නියෝජිතයන්ට, නිලධරයන්ට සහ සේවකයන්ට අදාළ සාමාජික රටවල් විසින් පිරිනමනු ලබන ගමන් පහසුකම් සම්බන්ධයෙන් එම සැලකිල්ලම ප්‍රදානය කළ යුතු ය.

**49 වන ව්‍යවස්ථාව : මේ පරිච්ඡේදය අදාළ කිරීම**

මේ පරිච්ඡේදයේ දක්වා ඇති සිද්ධාන්ත ස්වකීය නීතිය ප්‍රකාර ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා එක් එක් සාමාජික රට විසින් ස්වකීය දේශය ඇතුළත අවශ්‍ය යම් ක්‍රියාමාර්ගයක් ගත යුතු අතර, ඒ සාමාජික රට විසින් ගනු ලැබූ සවිස්තර ක්‍රියා මාර්ගය සම්බන්ධයෙන් ඒජන්සියට දැන්විය යුතු ය.

**50 වන ව්‍යවස්ථාව : අත් හැරීම**

මේ පරිච්ඡේදයෙහි විධිවිධාන සලසා ඇති පරිහාර, නිදහස් කිරීම සහ වරප්‍රසාද ඒජන්සියේ යහපත උදෙසා ප්‍රදානය කරනු ලබන අතර, යම් අත්හැරීමකින් ස්වකීය යහපතට හානිකර නොවන අවස්ථාවලදී ඒජන්සිය විසින් නිර්ණය කරනු ලබන යම් ප්‍රමාණයකට සහ යම් කොන්දේසි මත, ඒ පරිහාර, නිදහස් කිරීම සහ වරප්‍රසාද අත්හරිනු ලැබිය හැකි ය. ඒජන්සියේ මතය අනුව, යම් පරිහාරයක් යුක්තියේ ක්‍රියා මාර්ගයට බාධාවක් විය හැකි අවස්ථාවක, සහ ඒජන්සියේ යහපතට අගතියක් නොමැතිව එලෙස අත් හරිනු ලැබිය හැකි විටක, ස්වකීය කාර්ය මණ්ඩලයේ කිසිවකුගේ පරිහාර ඒජන්සිය විසින් අත් හරිනු ලැබිය හැකි ය.

## VIII වන පරිච්ඡේදය

### සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වීම, සාමාජිකත්වය අත්හිටුවීම සහ ක්‍රියාකාරකම් නතර කිරීම

**51 වන ව්‍යවස්ථාව : ඉල්ලා අස්වීම**

යම් සාමාජිකයකු විසින් මේ සම්මුතියට එළඹ, ඒ සාමාජිකයා සම්බන්ධයෙන් එය බලාත්මක වීමේ දිනට ඉක්බිතිව එළඹෙන අවුරුදු තුන ඉකුත් වීමෙන් පසුව, ඒජන්සියේ ප්‍රධාන කාර්යාලය වෙත ලිඛිත දැන්වීමක් දීමෙන් පසුව, කවර හෝ අවස්ථාවක, ඒ සාමාජිකයාට ඒජන්සියෙන් ඉල්ලා අස්විය හැකි ය. ඒජන්සිය විසින් ඒ දැන්වීම ලැබුණු බව මේ සම්මුතියේ තැන්පතුධාරී වශයෙන් බැංකුවට දැන්විය යුතු ය. ඒජන්සිය වෙත ඒ දැන්වීම ලැබුණේ යම් දිනයක ද, එදින සිට දින අනූවකට පසු යම් ඉල්ලා අස්වීමක් බලසහිත විය යුතු ය. යම් දැන්වීමක් බල සහිත නොවනතාක් කල් සාමාජිකයකු විසින් ඒ දැන්වීම ප්‍රත්‍යාදිෂ්ට කළ හැකි ය.

**52 වන ව්‍යවස්ථාව : සාමාජිකත්වය අත්හිටුවීම**

(අ) මේ සම්මුතිය යටතේ වූ ස්වකීය බැඳීම් කිසිවක් ඉටු කිරීමට සාමාජිකයකු විසින් පැහැර හරිනු ලැබුවහොත්, සභාව විසින් සම්පූර්ණ ඡන්දය දීමේ බලයේ බහුතරයක් ක්‍රියාත්මක කරමින් ස්වකීය සාමාජිකයන්ගේ බහුතර ඡන්දයකින් ඒ සාමාජිකයාගේ සාමාජිකත්වය අත්හිටුවනු ලැබිය හැකි ය.

(ආ) සාමාජිකත්වය අත්හිටුවනු ලැබ සිටින අතරතුර, මේ පරිච්ඡේදයෙහි සහ IX වන පරිච්ඡේදයෙහි විධිවිධාන සලස්වා ඇති ඉල්ලා අස්වීමේ අයිතිය සහ වෙනත් අයිතිවාසිකම් හැර, මේ සම්මුතිය යටතේ අයිතිවාසිකම් කිසිවක් සාමාජිකයකුට නොතිබිය යුතු ය. එහෙත් ස්වකීය සියලු බැඳීම්වලට යටත්ව සිටිය යුතු ය.

(ඇ) මේ සම්මුතියේ III වන පරිච්ඡේදයේ හෝ I වන ඇමුණුම යටතේ නිකුත් කරනු ලැබිය යුතු ඇප සහතිකයක් හෝ ප්‍රතිරක්ෂණයක් සඳහා සුදුසුකම නිර්ණය කිරීමේ කාර්ය සම්බන්ධයෙන් අත්හිටුවනු ලැබූ සාමාජිකයකු ඒජන්සියේ සාමාජිකයකු වශයෙන් සලකනු නොලැබිය යුතු ය.

(ඈ) සාමාජිකත්වය අත්හිටුවනු ලැබූ සාමාජිකයාගේ අත්හිටුවීමේ කාලය දීර්ඝ කිරීමට හෝ සාමාජිකයා යථා තත්ත්වයට පත් කිරීමට හෝ සභාව විසින් තීරණය කරනු ලැබුවහොත් මිස, ස්වකීය අත්හිටුවීමේ දින සිට එක් වර්ෂයකින්, අත්හිටුවනු ලැබූ සාමාජිකයා සාමාජිකයකු වීම නිතැතින්ම අවසන් විය යුතු ය.

**53 වන ව්‍යවස්ථාව : සාමාජිකයන් වීම අවසන් කෙරෙන රාජ්‍යයන්ගේ අයිතිවාසිකම් සහ යුතුකම්**

(අ) රාජ්‍යයක් විසින් සාමාජිකයකු වීම අවසන් කරන විට, ස්වකීය සාමාජිකත්වය අවසන් වීමට පෙර බලසහිත විය යුතු මේ සම්මුතිය යටතේ වූ ස්වකීය අවිනිශ්චිත බැඳීම් ඇතුළුව, ස්වකීය සියලු බැඳීම් සඳහා යටත්ව සිටිය යුතු ය.

(ආ) ඉහත (අ) වගන්තියට අගතියක් නොමැතිව, පිළිවෙළින් වූ නම් හිමිකම් පෑම් සහ බැඳීම් බේරුම්කිරීම සඳහා ඒජන්සිය විසින් එවැනි රාජ්‍යයක් සමඟ යම් ක්‍රියා මාර්ගයකට ඇතුළත් විය යුතු ය. එවැනි යම් ක්‍රියා මාර්ගයක් මණ්ඩල විසින් අනුමත කරනු ලැබිය යුතු ය.

**54 වන ව්‍යවස්ථාව : ක්‍රියාකාරකම් අත්හිටුවීම**

(අ) යුක්තිසහගත යයි මණ්ඩලය විසින් සලකනු ලබන කවර හෝ විටෙක, යම් නිශ්චිත කාල සීමාවක් සඳහා අලුත් ඇප සහතික නිකුත් කිරීම අත්හිටුවනු ලැබිය හැකි ය.

(ආ) හදිසි අවස්ථාවක දී, ඒ හදිසි අවස්ථාව පවත්නා කාලය නොඉක්මවන කාල සීමාවක් සඳහා ඒජන්සියේ සියලු කටයුතු මණ්ඩලය විසින් අත් හිටුවනු ලැබිය හැකි ය. එසේ වුවද, එවැනි අවස්ථාවක ඒජන්සියේ සහ තෘතීය පාර්ශ්වයන්ගේ සම්බන්ධතා ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය යම් ක්‍රියා මාර්ගයක් ඇති කරනු ලැබිය යුතු ය.

(ඇ) ක්‍රියාකාරකම් අත්හිටුවීම සඳහා වූ තීරණය මේ සම්මුතිය යටතේ සාමාජිකයන්ගේ බැඳීම් සම්බන්ධයෙන් හෝ ඇප සහතිකයක් හෝ ප්‍රතිරක්ෂණ ඔප්පුවක් දරන්නන් උදෙසා හෝ ඒජන්සියේ බැඳීම් සම්බන්ධයෙන් හෝ තෘතීය පාර්ශ්වයන් උදෙසා හෝ කිසිම බලපෑමක් නොවිය යුතු ය.

55 වන ව්‍යවස්ථාව: ඈවර කිරීම

(අ) ක්‍රියාකාරකම් නතර කොට ඒජන්සිය ඈවර කිරීමට සභාව විසින් විශේෂ බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය හැකි ය. එවිට, වත්කම් ක්‍රමවත්ව උපලබ්ධ කර ගැනීමට, සංරක්ෂණය කිරීමට හා ආරක්ෂා කිරීමට සහ බැඳීම් බේරුම් කිරීමට ආනුෂංගික කටයුතු හැර, සියලු කටයුතු ඒජන්සිය විසින් වහාම නැවැත්විය යුතු ය. අවසාන වශයෙන් බේරුම් කොට වත්කම් බෙදා හරිනු ලබන තෙක්, ඒජන්සිය පවත්වා ගෙන ගිය යුතු අතර, මේ සම්මුතිය යටතේ සාමාජිකයන්ගේ සියලු අයිතිවාසිකම් සහ බැඳීම් දුබල නොකොට නොකඩවා පවත්වා ගෙන යා යුතු ය.

(ආ) ඇප සහතික දරන්නන්ගේ සහ වෙනත් ණය හිමියන්ගේ සියලු බැරකම් නිදහස් කරනු ලබන තෙක්, හෝ ඒ සඳහා ප්‍රතිපාදන සලසනු ලබන තෙක්, සහ ඒ බෙදා හැරීම කිරීමට සභාව විසින් තීරණය කරනු ලබන තෙක්, වත්කම් කිසිවක් සාමාජිකයන්ට බෙදා දෙනු නොලැබිය යුතු ය.

(ඇ) ඉහත සඳහන් කරුණුවලට යටත්ව, ඒජන්සිය විසින් එහි ඉතිරි ව ඇති වත්කම් සහභාගත්ව ප්‍රාග්ධනයෙහි එක් එක් සාමාජිකයාගේ කොටස් ප්‍රමාණයට අනුප්‍රාප්තිකව සාමාජිකයන් වෙත බෙදා හරිනු ලැබිය යුතු ය. මේ සම්මුතියේ 1 වන ඇමුණුමෙහි සඳහන් සමානුග්‍රහ භාර අරමුදලේ ඉතිරිව ඇති වත්කම් ද, එක් එක් සමානුග්‍රහ සාමාජිකයා විසින් සමානුග්‍රහ කළ ආයෝජන, මුළු සමානුග්‍රහ ආයෝජනවලට දරන අනුපාතය අනුව සමානුග්‍රාහක සාමාජිකයන් වෙත ඒජන්සිය විසින් බෙදා හරිනු ලැබිය යුතු ය. ඒජන්සිය විසින්, ඒ වෙනුවෙන කරන ලද බේරුම් කොට ඇත්නම් මිස, ඒජන්සියේ හෝ සමානුග්‍රහ භාර අරමුදලේ හෝ වත්කම්වලින් තම කොටසට ඒ සාමාජිකයා හිමිකම් නොලැබිය යුතු ය. සෑම වත්කම් බෙදා හැරීමක්ම, සභාව විසින් තීරණය කරනු ලබන යම් අවස්ථාවල දී සහ අපක්ෂපාති සහ සාධාරණයයි සභාව විසින් සලකනු ලබන යම් ආකාරයකින් කරනු ලැබිය යුතු ය.

## IX වන පරිච්ඡේදය

## ආරාවුල් බේරුම් කිරීම

### 56 වන ව්‍යවස්ථාව: සම්මුතිය අර්ථ නිරූපනය කිරීම හා අදාළ කිරීම

(අ) ඒජන්සියේ යම් සාමාජිකයකු සහ ඒජන්සිය අතර හෝ ඒජන්සියේ සාමාජිකයන් අතර උද්ගත වන, මේ සම්මුතියේ විධිවිධාන අර්ථ නිරූපනය කිරීම හෝ අදාළ කිරීම් සම්බන්ධයෙන් වූ යම් ප්‍රශ්නයක් මණ්ඩලයේ තීරණය සඳහා මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. ප්‍රශ්නය විශේෂයෙන් ම බලපෑ ඇත්තා වූ ද ස්වදේශිකයකු මගින් මණ්ඩලයෙහි අධ්‍යක්ෂකාරයකින් නියෝජනය වී නොමැත්තා වූ ද යම් සාමාජිකයකු විසින් ඒ ප්‍රශ්නය සැලකිල්ලට භාජනය කරනු ලබන මණ්ඩලයේ යම් රැස්වීමකට සහභාගිවීමට නියෝජිතයකු යවනු ලැබිය හැකි ය.

(ආ) මණ්ඩලය විසින් ඉහත (අ) වගන්තිය යටතේ තීරණයක් දෙනු ලැබ ඇත්තා වූ අවස්ථාවක, ප්‍රශ්නය සභාව වෙත යොමු කරන ලෙස කවර හෝ යම් සාමාජිකයකු විසින් ඉල්ලා සිටිය හැකි අතර, එහි තීරණය අවසානාත්මක වන්නේ ය. සභාව වෙත කරන ලද යොමුවේ ප්‍රතිඵලය තෙක්, අවශ්‍ය යයි ඒජන්සිය විසින් සලකනු ලබනතාක් දුරට මණ්ඩලයේ තීරණයේ පදනම මත, ඒජන්සිය විසින් ක්‍රියා කළ හැකිය.

### 57 වන ව්‍යවස්ථාව: ඒජන්සිය සහ සාමාජිකයන් අතර ආරාවුල්

(අ) 56 වන ව්‍යවස්ථාවේ සහ (ආ) වගන්තියේ විධිවිධානවලට අගතියක් නොමැතිව, ඒජන්සිය සහ මේ ව්‍යවස්ථාවේ සාමාජිකයකු අතර හෝ ඒ සාමාජිකයාගේ අනුයෝජිතයකු අතර වූ යම් ආරවුලක් සහ ඒජන්සිය සහ සාමාජිකයකු වීම අවසන් කරනු ලැබූ රටක් (හෝ ඒ රටේ අනුයෝජිතයකු) අතර වූ යම් ආරාවුලක් මේ සම්මුතියේ II වන ඇමුණුමෙහි දක්වා ඇති කාර්ය පටිපාටිය අනුව බේරුම් කළ යුතු ය.

(ආ) ආයෝජකයකුගේ පුනරුදේශක වශයෙන් ක්‍රියා කරමින් ඒජන්සියේ හිමිකම්පෑම් සම්බන්ධයෙන් වූ ආරාවුල් (1) මේ සම්මුතියේ II වන ඇමුණුමෙහි දක්වා ඇති කාර්ය පටිපාටිය අනුව හෝ (II) ඒ ආරාවුල් බේරුම් කිරීම සඳහා වූ විකල්ප ක්‍රමයක් හෝ ක්‍රම ගැන ඒජන්සිය සහ අදාළ සාමාජිකයා අතර ඇතුළත් විය යුතු එකඟවීමක් අනුව හෝ බේරුම් කර ගත යුතු ය. පසුව සඳහන් අවස්ථාව සම්බන්ධයෙන් වන විට, මේ සම්මුතියේ II වන ඇමුණුම එවැනි එකඟවීමක් සඳහා වූ පදනමක් වශයෙන් යෙදිය යුතු අතර, ඒ එක් එක් අවස්ථාවේ දී අදාළ සාමාජිකයාගේ ප්‍රදේශයෙහි ඒජන්සිය විසින් ක්‍රියා කාරකම් භාර ගැනීමට පෙරාතුව මණ්ඩලය විසින් විශේෂ බහුතර ඡන්දයෙන් අනුමත කරනු ලැබිය යුතු ය.

### 58 වන ව්‍යවස්ථාව: ඇප සහතිකයක් හෝ ප්‍රතිරක්ෂණයක් දරන්නන්ට අදාළ වන ආරාවුල්

ගිවිසුමක පාර්ශ්වකරුවන් අතර ඇප සහතිකයක් හෝ ප්‍රතිරක්ෂණයක් සම්බන්ධයෙන් වූ ගිවිසුමක් යටතේ උද්ගතවන යම් ආරාවුලක්, ඒ ඇප සහතික හෝ ප්‍රතිරක්ෂණ ගිවිසුමෙහි විධිවිධාන සලසා ඇති පරිදි හෝ එහි සඳහන් පරිදි වූ රීතිවලට අනුකූලව, අවසාන තීරණය සඳහා බේරුම් කරනු ලැබීමට ඉදිරිපත් කළ යුතු ය.

## X වන පරිච්ඡේදය

### සංශෝධන

**59 වන ව්‍යවස්ථාව: සභාව විසින් සංශෝධනය කිරීම**

(අ) මුළු ඡන්ද බලයෙන් පහෙන් හතරක් ක්‍රියාත්මක කරන, පාලකවරයන්ගෙන් පහෙන් තුනක ඡන්දයෙන් මේ සම්මුතිය සහ එහි ඇමුණුම් සංශෝධනය කරනු ලැබිය හැකි ය ; එසේ වුව ද—

(i) 51 වන ව්‍යවස්ථාවෙන් විධිවිධාන සලසා ඇති පරිදි ඒජන්සියෙන් ඉල්ලා අස්වීමේ අයිතිය හෝ 8 වන ව්‍යවස්ථාවේ (ඇ) වගන්තියෙන් විධිවිධාන සලසා ඇති පරිදි වගකීම පිළිබඳ සීමාව වෙනස් කෙරෙන යම් සංශෝධනයකට සියලු පාලකවරයන්ගේ අස්ත්‍යාර්ථක ඡන්දය අවශ්‍ය වන්නේ ය ; සහ

(ii) මේ සම්මුතියේ I වන ඇමුණුමෙහි 1 වන ව්‍යවස්ථාව සහ 3 වන ව්‍යවස්ථාවේ විධිවිධාන මගින් සලසා ඇති පාඩු කොටස් කර ගැනීමේ ක්‍රියා මාර්ගය වෙනස් කෙරෙන්නා වූ ද ඒ යටතේ යම් සාමාජිකයකුගේ වගකීම වැඩි කිරීමේ ප්‍රතිඵලය ගෙන දෙන්නා වූ ද යම් සංශෝධනයක් සම්බන්ධයෙන් ඒ එක් එක් සාමාජිකයාගේ පාලකවරයාගේ අස්ත්‍යාර්ථක ඡන්දය අවශ්‍ය වන්නේ ය.

(ආ) මේ සම්මුතියේ 'අ' සහ 'ආ' උපලේඛන සභාව විසින් විශේෂ බහුතර ඡන්දයෙන් සංශෝධනය කරනු ලැබිය හැකි ය.

(ඇ) යම් සංශෝධනයකින් මේ සම්මුතියේ I වන ඇමුණුමෙහි වූ යම් විධිවිධානයක් කෙරෙහි බලපෑමක් වන්නේ නම්, මුළු ඡන්ද සංඛ්‍යාවෙහි සමානුග්‍රාහක සාමාජිකයන්ට සහ සමානුග්‍රාහක ආයෝජන ධාරක රටවල්වලට ඒ ඇමුණුමෙහි 7 වන ව්‍යවස්ථාව යටතේ වෙන් කර දෙනු ලැබූ අතිරේක ඡන්ද සංඛ්‍යාව ඇතුළත් විය යුතු ය.

**60 වන ව්‍යවස්ථාව: කාර්ය පටිපාටිය**

මේ සම්මුතිය සංශෝධනය කිරීම සඳහා වූ යම් යෝජනාවක් සාමාජිකයකුගෙන් හෝ පාලකවරයකුගෙන් හෝ අධ්‍යක්ෂවරයකුගෙන් ආරම්භ වුව ද, එය මණ්ඩලයේ සභාපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර, ඔහු එම යෝජනාව මණ්ඩලය ඉදිරියෙහි තැබිය යුතු ය. යෝජිත සංශෝධනය මණ්ඩලය විසින් නිර්දේශ කරනු ලැබුවහොත්, එය 59 වන ව්‍යවස්ථාව අනුව අනුමත කිරීම සඳහා සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය. යම් සංශෝධනයක් සභාව විසින් යථා පරිදි අනුමත කරනු ලැබ ඇති විට, සියලු සාමාජිකයන් අමතනු ලැබූ විධිමත් සන්දේශයක් මගින් ඒජන්සිය විසින් ඒ බව සහතික කළ යුතු ය. සභාව විසින් වෙනස් දිනයක් නිශ්චය කර ඇත්නම් මිස, සංශෝධන විධිමත් ලෙස දැන්වීමේ දිනයට පසු දින අනූවකින් ඒවා සියලු සාමාජිකයන් සඳහා බලාත්මක විය යුතු ය.

## XI වන පරිච්ඡේදය

### අවසාන විධිවිධාන

61 වන ව්‍යවස්ථාව : බලාත්මක වීම

(අ) මේ සම්මුතිය බැංකුවේ සියලු සාමාජිකයන් සහ ස්විට්සර්ලන්තය වෙනුවෙන් අත්සන් කිරීම සඳහා විවෘත විය යුතු අතර, අත්සන් කරන රාජ්‍යයන් විසින්, තම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කාර්ය පටිපාටිවලට අනුකූලව එය ස්ථිර කරනු ලැබීමට, පිළිගනු ලැබීමට හෝ අනුමත කරනු ලැබීමට යටත් වන්නේ ය.

(ආ) පළමුවන ගණයට අයත් අත්සන් කරන රාජ්‍යයන් වෙනුවෙන් ස්ථිර කිරීමේ, පිළිගැනීමේ හෝ අනුමත කිරීමේ සාධන පත්‍ර පහකට නොඅඩු සංඛ්‍යාවක් තැන්පත් කරනු ලැබුවා වූ ද, දෙවන ගණයට අයත් අත්සන් කරන රාජ්‍යයන් වෙනුවෙන් එවැනි සාධන පත්‍ර පහළොවකට නොඅඩු සංඛ්‍යාවක් තැන්පත් කරනු ලැබුවා වූ ද දිනයෙහි මේ සම්මුතිය බලාත්මක වන්නේ ය. එසේ වුව ද මේ රාජ්‍යයන්ගේ මුළු දායක මුදල 5 වන ව්‍යවස්ථාවෙහි නියමිත පරිදි ඒජන්සියේ බලයලත් ප්‍රාග්ධනයෙන් තුනෙන් එකකට නොඅඩු මුදලක් විය යුතු ය.

(ඇ) මේ සම්මුතිය බලාත්මක වීමෙන් පසුව, ස්ථිර කිරීමේ, පිළිගැනීමේ හෝ අනුමත කිරීමේ ස්වකීය සාධන පත්‍රය තැන්පත් කරන එක් එක් රාජ්‍ය සඳහා ඒ සාධන පත්‍රය තැන්පත් කිරීමේ දින සිට මේ සම්මුතිය බලාත්මක වන්නේ ය.

(ඈ) අත්සන් කිරීම සඳහා සම්මුතිය විවෘත කිරීමෙන් පසු, වර්ෂ දෙකක් ඇතුළත මේ සම්මුතිය බලාත්මක නොවුවහොත්, එහි ඉදිරි ක්‍රියා මාර්ගය තීරණය කිරීම පිණිස ඊට සම්බන්ධතාවක් ඇති රටවල සම්මේලනයක් බැංකුවේ අධිපතිවරයා විසින් කැඳවිය යුතු ය.

62 වන ව්‍යවස්ථාව : ප්‍රාරම්භක රැස්වීම

මේ සම්මුතිය බලාත්මක වූ විට, බැංකුවේ අධිපතිවරයා විසින් සභාවේ ප්‍රාරම්භක රැස්වීම කැඳවිය යුතු ය. මේ රැස්වීම, මේ සම්මුතිය බලාත්මක වූ දින සිට දින හැටක් ඇතුළත නැතහොත් ඉන් පසු හැකි ඉක්මණින්, ඒජන්සියේ ප්‍රධාන කාර්යාලයෙහි පවත්වනු ලැබිය යුතු ය.

63 වන ව්‍යවස්ථාව : ලේඛනාගාරය

මේ සම්මුතිය සහ එහි සංශෝධන ස්ථිර කිරීමේ, පිළිගැනීමේ හෝ අනුමත කිරීමේ සාධන පත්‍ර බැංකුව වෙත තැන්පත් කළ යුතු අතර, එය මේ සම්මුතියේ ලේඛනාගාරය වශයෙන් ක්‍රියා කළ යුතු ය. ලේඛනාගාරය විසින් මේ සම්මුතියේ සහතික පිටපත් රාජ්‍යයන්ට, බැංකුවේ සාමාජිකයන්ට සහ ස්විට්සර්ලන්තයට යැවිය යුතු ය.

64 වන ව්‍යවස්ථාව : ලියාපදිංචි කිරීම

එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියේ 102 වන ව්‍යවස්ථාවට සහ මහා මණ්ඩලය විසින් සම්මත කරන ලද ඒ යටතේ වූ නියෝගවලට අනුකූලව, ලේඛනාගාරය විසින් මේ සම්මුතිය එක්සත් ජාතීන්ගේ ලේකම් කාර්යාලයෙහි ලියාපදිංචි කළ යුතු ය.

65 වන ව්‍යවස්ථාව : නිවේදන

ලේඛනාගාරය විසින් අත්සන් කරන සියලු රාජ්‍යයන්ට සහ මේ සම්මුතිය බලාත්මක වූ විට ඒජන්සියට පහත දැක්වෙන කරුණු දැක්විය යුතුය :—

(අ) මේ සම්මුතියේ අත්සන් ;

(ආ) 63 වන ව්‍යවස්ථාවට අනුකූලව ස්ථිර කිරීමේ, පිළිගැනීමේ සහ අනුමත කිරීමේ සාධන පත්‍ර තැන්පත් කිරීම් ;

(ඇ) 61 වන ව්‍යවස්ථාව අනුව මේ සම්මුතිය බලාත්මක වන දිනය ;

(ඈ) 66 වන ව්‍යවස්ථාව අනුව දේශීය අදාළ කිරීමෙන් බැහැර කිරීම් ; සහ

(ඉ) 51 වන ව්‍යවස්ථාව අනුව සාමාජිකයකු ඒජන්සියෙන් ඉල්ලා අස්වීම.

**66 වන ව්‍යවස්ථාව : දේශීය අදාළ කිරීම**

ස්ථිර කිරීමේ, පිළිගැනීමේ හෝ අනුමත කිරීමේ අවස්ථාවේ දී හෝ ඉන් අනතුරුව මේ සම්මුතියේ ලේඛනාගාරය වෙත කරන ලද ලිඛිත දැන්වීමක් මගින් බැහැර කරනු ලැබූ දේශ හැර, යම් දේශයක ජාත්‍යන්තර සම්බන්ධතා සඳහා සාමාජිකයෙකු වගකිව යුතු වන්නේ ද, එම දේශ ඇතුළුව, සාමාජිකයකුගේ බලසීමාව යටතේ වූ සියලු දේශවලට මේ සම්මුතිය අදාළ වන්නේ ය.

**67 වන ව්‍යවස්ථාව : කලින් කල කරනු ලබන සමාලෝචන**

(අ) ස්වකීය පරමාර්ථ ඉටු කිරීම පිණිස ඒජන්සියේ හැකියාවන්, වර්ධනය කිරීමට අවශ්‍ය වන්නා වූ යම් වෙනස්කම් ඇති කිරීමේ අරමුණු ඇතිව ඒජන්සියේ කටයුතු පිළිබඳව මෙන්ම අත් කර ගනු ලැබූ ප්‍රතිඵල පිළිබඳව සභාව විසින් කලින් කල පුළුල් විමර්ශන පැවැත්විය යුතු ය.

(ආ) ඒ ප්‍රථම විමර්ශනය මේ සම්මුතිය බලාත්මක වීමෙන් පසු වර්ෂ පහකින් පවත්වනු ලැබිය යුතු ය. ඉන් අනතුරුව පවත්වනු ලබන විමර්ශනවල දින සභාව විසින් නිර්ණය කළ යුතු ය.

ජාත්‍යන්තර ප්‍රතිසංස්කරණ හා සංවර්ධන බැංකුවේ ලේඛනාගාරයේ තැන්පත් කර තිබෙන්නට ඇරිය යුතු එක් පිටපතක් වශයෙන් සෝල් හි දී සාදනු ලැබ, මේ සම්මුතිය යටතේ ඊට පවරා ඇති කාර්තව්‍ය මුදුන් පත් කිරීම පිණිස ස්වකීය එකඟත්වය මෙහි පහත ඇති ස්වකීය අත්සනින් දක්වා ඇත.

## I වන ඇමුණුම

### 2 වන ව්‍යවස්ථාව යටතේ සමානුග්‍රහ ආයෝජනවලට ඇපවීම

**1 වන ව්‍යවස්ථාව : සමානුග්‍රහය**

(අ) යම් ජාතියක ආයෝජකයකු විසින් හෝ යම් ජාතික හෝ ජාති කීපයක ආයෝජකයින් විසින් කරනු ලබන ආයෝජන සම්බන්ධයෙන් ඇපවීම සඳහා යම් සාමාජිකයකු විසින් සමානුග්‍රහය දැක්විය හැකි ය.

(ආ) මේ ඇමුණුමේ 3 වන ව්‍යවස්ථාවේ (ආ) සහ (ඇ) වගන්තිවල විධිවිධාන වලට යටත්ව, එක් එක් සමානුග්‍රහ සාමාජිකයකු විසින්, සමානුග්‍රහ ආයෝජන පිළිබඳව වූ අලාභ, එම අලාභ මේ ඇමුණුමේ 2 වන ව්‍යවස්ථාවේ සඳහන් සමානුග්‍රහ භාර අරමුදලින් ආවරණය කළ නොහැකි වූ විට ද එසේ ආවරණය කළ නොහැකි ප්‍රමාණයට ද, අනෙකුත් සමානුග්‍රහ සාමාජිකයන් සමඟ සියලුම සාමාජිකයන් විසින් සමානුග්‍රහය දක්වන ලද ආයෝජන ඇප යටතේ වූ උපරිම අවිනිශ්චිත බැරකම්වල මුළු ප්‍රමාණයට එම සාමාජිකයා විසින් සමානුග්‍රහ දක්වන ලද අවිනිශ්චිත බැරකම් දරන අනුපාතයට අනුව ද අනෙකුත් සමානුග්‍රහ සාමාජිකයන් සමඟ කොටස් කර ගත යුතු ය.

(ඇ) මේ ඇමුණුම යටතේ ඇප සහිතව නිකුත් කිරීම සම්බන්ධයෙන් ඒජන්සිය විසින් තීරණ ගැනීමේ දී, මේ ඇමුණුම යටතේ සමානුග්‍රහ සාමාජිකයන්ට ස්වකීය බැඳීම් ඉටු කිරීමට හැකිවීමේ ඉඩකඩ ගැන නිසි සැලකිල්ල යොමු කළ යුතු අතර අදාළ ධාරක රටවල් විසින් ඒ සමඟ සමානුග්‍රහය දක්වනු ලැබූ ආයෝජනවලට ප්‍රමුඛතාව දිය යුතු ය.

(ඈ) මේ ඇමුණුම යටතේ ඒජන්සියේ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ඒජන්සිය විසින් කලින් කල සමානුග්‍රහ සාමාජිකයන්ගේ අදහස් විමසිය යුතු ය.

**2 වන ව්‍යවස්ථාව : සමානුග්‍රහ භාර අරමුදල**

(අ) වාර මුදල් සහ ආදායම් ආයෝජනය කිරීමෙන් ලැබෙන ආදායම ඇතුළුව සම්ප්‍රදාන ආයෝජන ඇප සහතිකවලට ආරෝපනය කළ හැකි වාර මුදල් සහ වෙනත් ආදායම් සමානුග්‍රහ භාර අරමුදල යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු වෙනම ගිණුමක තබා ගත යුතු ය.

(ආ) සියලු පරිපාලන වියදම් සහ මේ ඇමුණුම යටතේ නිකුත් කරන ලද ඇප වලට ආරෝපනය කළ හැකි හිමිකම් පෑම් සම්බන්ධයෙන් වූ සියලු ගෙවීම් සමානුග්‍රහ භාර අරමුදලින් ගෙවිය යුතු ය.

(ඇ) සමානුග්‍රහ භාර අරමුදලේ වත්කම්, සමානුග්‍රහ සාමාජිකයන්ගේ හවුල් ගිණුමේ තබා ගෙන පරිපාලනය කරනු ලැබිය යුතු අතර, එය ඒජන්සියේ වත්කම් වලින් වෙන් කර වෙනත් ගිණුමක් වශයෙන් තබා ගත යුතු ය.

**3 වන ව්‍යවස්ථාව : සමානුග්‍රහ සාමාජිකයන් වෙත කරනු ලබන කැඳවීම්**

(අ) සමානුග්‍රහ ඇපයක් යටතේ අලාභයක් සම්බන්ධයෙන් ඒජන්සිය විසින් යම් මුදලක් ගෙවිය යුතු වනතාක් ප්‍රමාණයට ද එම මුදල සමානුග්‍රහ භාර අරමුදලේ වත්කම්වලින් ගෙවිය නොහැකි වනතාක් ප්‍රමාණයට ද මේ ඇමුණුමේ 1 වන ව්‍යවස්ථාවේ (ආ) වගන්තිය අනුව තීරණය කරනු ලබන පරිදි වූ ඒ මුදලින් ස්වකීය කොටස එම අරමුදලට ගෙවන ලෙස එක් එක් සමානුග්‍රහ සාමාජිකයාට ඒජන්සිය විසින් නියම කළ යුතු ය.

(ආ) කැඳවීමක් ගෙවීමේ ප්‍රතිඵලයක් වශයෙන් තමා විසින් ගෙවන ලද මුළු මුදල් ප්‍රමාණය තමා විසින් සමානුග්‍රහය දක්වන ලද ආයෝජන ආවරණය වන ඇපවල මුළු ප්‍රමාණයට වඩා වැඩි වන්නේ නම්, මේ ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව වූ යම් කැඳවීමක් අනුව කිසිම මුදලක් ගෙවීමට කිසිම සාමාජිකයකු යටත් නොවිය යුතු ය.

(ඇ) යම් සාමාජිකයකු විසින් සමානුග්‍රහය දක්වන ලද ආයෝජනයක් ආවරණය වන ඇපය අවසාන වූ විට එම සාමාජිකයාගේ වගකීම එම ඇපවීමේ ප්‍රමාණයට සමාන ප්‍රමාණයකින් අඩු කරනු ලැබිය යුතු ය; තවද සමානුග්‍රහ ආයෝජනයක් සම්බන්ධයෙන් වූ යම් හිමිකම් පෑමක් ඒජන්සිය විසින් ගෙවනු ලැබූ විට එම වගකීම ප්‍රමාණානුකූලව අඩු කළ යුතු වන අතර, එසේ නොවුවහොත් එම මුදල ගෙවන වේලාවේ දී ඉතිරිව තිබූ සියලු සමානුග්‍රහ ඇප අවසාන වනතුරු බල සහිතව පැවතිය යුතු ය.

(ඈ) ඉහත (ආ) සහ (ඇ) වගන්තිවල අඩංගු සීමාකිරීම නිසා මේ ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුව වූ කැඳවීමක මුදල ගෙවීමට යම් සමානුග්‍රහ සාමාජිකයකු යටත් නොවේ නම් හෝ එවැනි යම් කැඳවීමක් අනුව අයවිය යුතු මුදල ගෙවීම යම් සමානුග්‍රහ සාමාජිකයකු විසින් පැහැර හරිනු ලැබුවහොත්, එම මුදල ගෙවීම පිළිබඳ වගකීම අනෙකුත් සමානුග්‍රහ සාමාජිකයන් විසින් ප්‍රමාණානුකූලව කොටස් කර ගත යුතු ය. මේ වගන්තිය අනුව සාමාජිකයන්ගේ වගකීම් ඉහත (ආ) සහ (ඇ) වගන්තිවල දක්වා ඇති සීමාකිරීම්වලට යටත් විය යුතු ය.

(ඉ) මේ ව්‍යවස්ථාව අනුව වූ කැඳවීමක් අනුව සමානුග්‍රහ සාමාජිකයකු විසින් කරනු ලබන යම් ගෙවීමක් අකලස්ව ද නිදහසේ භාවිතා කළ හැකි ව්‍යවහාර මුදල්වලින් ද ගෙවිය යුතු ය.

4 වන ව්‍යවස්ථාව: ව්‍යවහාර මුදල් අගය කිරීම සහ ආපසු ගෙවීම

ප්‍රාග්ධන දායක මුදල්වලට අදාළව ව්‍යවහාර මුදල් අගය කිරීම සහ මුදල් ආපසු ගෙවීම් සම්බන්ධයෙන් මේ සම්මුතියේ විධිවිධාන සමානුග්‍රහ ආයෝජන වෙනුවෙන් සාමාජිකයන් විසින් ගෙවනු ලබන අරමුදල්වලට අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ කර ගත යුතු ය.

5 වන ව්‍යවස්ථාව: ප්‍රතිරක්ෂණය

(අ) ඒජන්සිය විසින් මේ ඇමුණුමේ 1 වන ව්‍යවස්ථාවේ දක්වා ඇති කොන්දේසි යටතේ, සාමාජිකයකුට, එහි ඒජන්සියක, මේ සම්මුතියේ 20 වන ව්‍යවස්ථාවේ (අ) වගන්තියේ අර්ථ කථනය කර ඇති පරිදි වූ ප්‍රාදේශීය ඒජන්සියකට හෝ සාමාජික රටවල පුද්ගලික රක්ෂකයකුට ප්‍රතිරක්ෂණය සැලසිය හැකි ය. ඇප සහතිකවලට අදාළව මේ ඇමුණුමේ විධිවිධාන සහ මේ සම්මුතියේ 20 සහ 21 වන ව්‍යවස්ථාවල විධිවිධාන, මේ වගන්තිය යටතේ සලසනු ලබන ප්‍රතිරක්ෂණවලට, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ කර ගත යුතු ය.

(ආ) මේ ඇමුණුම යටතේ ඒජන්සිය විසින් ඇප වූ ආයෝජන සඳහා ඒජන්සිය විසින් ප්‍රතිරක්ෂණය ලබා ගත යුතු අතර, ඒ ප්‍රතිරක්ෂණවල පිරිවැය සමානුග්‍රහ භාර අරමුදලෙන් දරනු ලැබිය යුතු ය. සලසන ලද ප්‍රතිරක්ෂණයේ හේතුවෙන් මේ ඇමුණුමේ 1 වන ව්‍යවස්ථාවේ (ආ) වගන්තියේ සඳහන් සමානුග්‍රහ සාමාජිකයන්ගේ පාඩු බෙදා ගැනීමේ වගකීම, අඩු කළ හැකි ද; එසේ අඩු කළ හැකි නම් ඒ කවර ප්‍රමාණයකට ද යන වග මණ්ඩලය විසින් තීරණය කළ හැකි ය.

6 වන ව්‍යවස්ථාව :—මෙහෙයුම් ප්‍රතිපත්ති

මේ ඇමුණුමේ විධිවිධානවලට හානියක් නොමැතිව, මේ සම්මුතියේ III වන පරිච්ඡේදයේ ඇප සහතික පිළිබඳ ක්‍රියාකාරකම් පිළිබඳව වූ විධිවිධාන සහ මේ සම්මුතියේ IV වන පරිච්ඡේදය යටතේ මූල්‍ය කළමනාකරණය පිළිබඳ විධිවිධාන, සමානුග්‍රහ ආයෝජන ඇප සහතික සම්බන්ධයෙන් අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ කර ගත යුතු ය. එහෙත්,

(i) එම ආයෝජන කරනු ලබන්නේ මේ ඇමුණුමේ 7 වන ව්‍යවස්ථාවේ (අ) වගන්තිය යටතේ සුදුසුකම් ලත් ආයෝජකයකු හෝ ආයෝජකයන් විසින් යම් සාමාජිකයකුගේ දේශයක විශේෂයෙන් සංවර්ධනය වන සාමාජිකයකුගේ දේශයක නම් එම ආයෝජන සමානුග්‍රහය සඳහා සුදුසුකම් ලබයි.

(ii) මේ ඇමුණුම යටතේ නිකුත් කරන ලද යම් ඇප සහතිකයක හෝ ප්‍රතිරක්ෂණයක සඳහා ඒජන්සිය මත වන කම් සම්බන්ධයෙන් වගකිව යුතු නොවන අතර, මේ ඇමුණුම අනුව ඇති කර ගන්නා සෑම ඇප සහතික හෝ ප්‍රතිරක්ෂණ ගිවිසුමකින් ද ප්‍රකාශිතව ම එසේ විධිවිධාන සැලැස්විය යුතු ය.

**7 වන ව්‍යවස්ථාව :—ඡන්දය දීම**

සමානුග්‍රහ ආයෝජන පිළිබඳ තීරණවල දී එක් එක් සමානුග්‍රහ සාමාජිකයාට එහි සමානුග්‍රාහකත්වයේ පදනම මත ඇප වූ හෝ ප්‍රතිරක්ෂණය කරන ලද ප්‍රමාණයට සමාන එක් එක් විශේෂ අවකරණ අයිතිවාසිකම් 10,000 සඳහා එක් අතිරේක ඡන්දයක් තිබිය යුතු අතර සමානුග්‍රහ ආයෝජනයක් පිළිගන්නා එක් එක් සාමාජිකයාට, එම සාමාජිකයා විසින් පිළිගත් යම් සමානුග්‍රහ ආයෝජන වෙනුවෙන්, ඇප වූ හෝ ප්‍රතිරක්ෂණය කරන ලද ප්‍රමාණයට සමාන එක් එක් විශේෂ අවකරණ අයිතිවාසිකම් 10,000 සඳහා එක් අතිරේක ඡන්දයක් තිබිය යුතු ය. එම අතිරේක ඡන්දය පාවිච්චි කළ යුතු වන්නේ සමානුග්‍රහ ආයෝජනවලට අදාළ තීරණය සඳහා පමණක් වන අතර එසේ නොවේ නම් සාමාජිකයන්ගේ ඡන්දය දීමේ බලය තීරණය කිරීමේ දී එය නොසලකා හැරිය යුතු ය.

## II වන ඇමුණුම

### 57 වන ව්‍යවස්ථාව යටතේ සාමාජිකයකු හා ඒජන්සිය අතර ආරාවුල් සමථයකට පත් කිරීම

**1 වන ව්‍යවස්ථාව :—ඇමුණුම අදාළ වීම**

57 වන ව්‍යවස්ථාවේ (ආ) (ii) වගන්තිය අනුව නියෝජ්‍යායතනය සාමාජික යකු සමග එකඟවීමකට ඇතුළත් වී ඇති අවස්ථාවල දී හැර, මේ සම්මුතියේ 57 වන ව්‍යවස්ථාවේ විෂය පථය ඇතුළතට ගැනෙන සියලුම ආරාවුල් මේ ඇමුණුමේ දක්වා ඇති කාර්ය පටිපාටියට අනුකූලව සමථයකට පත් කර ගත යුතු ය.

**2 වන ව්‍යවස්ථාව :—සාකච්ඡා මාර්ගය**

මේ ඇමුණුමේ විෂය පථය යටතේ වූ ආරාවුලක පාර්ශ්වකරුවන් සමගි කිරීම හෝ බේරුම් කිරීම අපේක්ෂා කිරීමට පළමුව එම ආරාවුල සාකච්ඡා මාර්ගයෙන් සමථයකට පත් කර ගැනීමට උත්සාහ කළ යුතු ය. සාකච්ඡා මාර්ගයකට එළඹීමට කරන ලද ඉල්ලීමේ දිනයට පසු දින එකසිය විස්සක කාල පරිච්ඡේදයක් ඇතුළත සමථයක් ඇති කර ගැනීමට පාර්ශ්වකරුවන් අපොහොසත් වුවහොත් සාකච්ඡා මාර්ගයෙන් සමථයක් ඇති කර ගැනීමේ හැකියාව අවසාන වූ ලෙස සැලකිය යුතු ය.

**3 වන ව්‍යවස්ථාව :—සමගි කිරීම**

(අ) ආරාවුල සාකච්ඡා මාර්ගයෙන් විසඳා ගනු නොලැබුවේ නම්, පළමුවෙන් මේ ව්‍යවස්ථාවේ විධිවිධාන සලසා ඇති සමගි කිරීමේ කාර්ය පටිපාටිය අනුගමනය කිරීමට පාර්ශ්වයන් විසින් අන්‍යොන්‍ය කැමැත්තෙන් තීරණය කර ඇත්නම් මිස, දෙපාර්ශ්වයෙන් එක් පාර්ශ්වයක් විසින් එම ආරාවුල මේ ඇමුණුමේ 4 වන ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව බේරුම් කිරීම සඳහා ඉදිරිපත් කළ හැකි ය.

(ආ) සමගි කිරීම අපේක්ෂා කරන එකඟවීමේ, ආරාවුලට පාත්‍ර වූ කාරණය ද ඒ සම්බන්ධයෙන් පාර්ශ්වකරුවන්ගේ හිමිකම්පෑම් ද හැකිනම්, පාර්ශ්වයන් විසින් එකඟ වූ සමගිකරුගේ නම ද නිශ්චිතව සඳහන් කළ යුතු ය. සමගිකරු සම්බන්ධයෙන් එකඟත්වයකට එළඹ නොමැති අවස්ථාවක දී සමගිකරුවකු පත් කරන ලෙස පාර්ශ්වකරුවන් විසින් හවුලේ, (මෙහි මින්මතු අයි. සී. එස්. අයි. ඩී. යයි සඳහන් කරනු ලබන) ආයෝජන ආරාවුල් සමථයකට පත් කිරීම සඳහා වූ ජාත්‍යන්තර මධ්‍යස්ථානයේ මහලේකම්වරයාගෙන් හෝ අන්තර්ජාතික සභාපතිවරයාගෙන් හෝ ඉල්ලා සිටිය හැකි ය. සමගි කිරීමක් අපේක්ෂා කිරීම සඳහා වූ එකඟවීමෙන් දින අනූවක් ඇතුළත සමගිකරු පත්කර නැත්නම් සමගි කිරීමේ කාර්ය පටිපාටිය අවසන් විය යුතු ය.

(ඇ) වෙනත් ආකාරයකට, මේ ඇමුණුමේ විධිවිධාන සලස්වා ඇත්නම් හෝ පාර්ශ්වකරුවන් විසින් එකඟ වී ඇත්නම් හෝ මිස, සමගි කිරීමේ කාර්ය පටිපාටිය පාලනය කෙරෙන රීති සමගිකරු විසින් නිශ්චය කළ යුතු ය. මේ කාරණයේ දී සමගිකරු රාජ්‍යයන් සහ වෙනත් රාජ්‍යවල වැසියන් අතර ආයෝජන ආරාවුල් සමථයකට පත් කිරීම පිළිබඳ සම්මුතියක් අනුව පිළිගත් සමගි කිරීමේ රීති ගුරු කොට ගත යුතු ය.

(ඈ) පාර්ශ්වකරුවන් සමගිකරුට සද්භාවයෙන් සහයෝගී විය යුතු අතර විශේෂයෙන් ම, ඔහුගේ කටයුතු ඉටු කිරීමෙහි ලා ඔහුට සහාය විය හැකි සියලු තොරතුරු හා ලිපි ලේඛන ආදිය ඔහුට සැපයිය යුතු ය. ඔවුන් ඔහුගේ නිර්දේශවලට ඔවුන්ගේ බලවත් සැලකිල්ල යොමු කළ යුතු ය.

(ඉ) පාර්ශ්වකරුවන් විසින් අන්‍යාකාරයට එකඟ වී ඇත්නම් මිස, සමගිකරු, ඔහුගේ පත්වීමේ දිනයෙන් දින එකසිය අසූවක් ඇතුළත ඔහුගේ ප්‍රයත්නවල ප්‍රතිඵල වාර්තා කෙරෙන්නා වූ ද පාර්ශ්වකරුවන් අතර මතභේදයට ලක් වූ කාරණා හා ඒවා සමථයකට පත් කිරීම සඳහා ඔහුගේ යෝජනා දක්වෙන්නා වූ ද වාර්තාවක් පාර්ශ්වකරුවන්ට සැපයිය යුතු ය.

(ඊ) වාර්තාව ලැබීමෙන් පසු දින 60 ක් ඇතුළත එක් එක් පාර්ශ්වකරු විසින් එම වාර්තාව පිළිබඳ තමන්ගේ අදහස් අනෙක් පාර්ශ්වකරුට ලියවිල්ලකින් ප්‍රකාශ කළ යුතු ය.

(උ) (i) ඉහත (ඉ) වගන්තියෙන් නියම කරන ලද කාල පරිච්ඡේදය ඇතුළත තමන්ගේ වාර්තාව ඉදිරිපත් කිරීම සමගිකරු විසින් පැහැර හරිනු ලැබ ඇත හොත් ; හෝ

(ii) වාර්තාව ලැබීමෙන් දින 60 ක් ඇතුළත එම වාර්තාවේ ඇතුළත් සියලුම යෝජනා භාර ගැනීමට පාර්ශ්වකරුවන් පැහැර හැර ඇතහොත් ; හෝ

(iii) සමගිකරුගේ වාර්තාව ලැබීමෙන් දින 60 ක් ඇතුළත, වාර්තාව පිළිබඳ අදහස් හුවමාරු කර ගැනීමෙන් පසුව මතභේදයට තුඩු දුන් සියලු කාරණා සම්පය කට පත් කර ගැනීමක් පිළිබඳව පාර්ශ්වකරුවන් එකඟත්වයකට පත් වීමට අපොහොසත් වූවහොත් ; හෝ

(iv) ඉහත (ඊ) වගන්තියේ නියමිත පරිදි ස්වකීය අදහස් කිරීමට පාර්ශ්ව කරුවකු විසින් පැහැර හැර ඇතහොත් ; **හෝ**

මිස, සමගි කිරීමට දෙපාර්ශ්වයෙන් එක් පාර්ශ්වයකටවත් බේරුම් කිරීමක් අපේක්ෂා කිරීමට හිමිකම් නොලැබිය යුතු ය.

**(ඌ) පාර්ශ්වකරුවන් විසින් අන්‍යාකාරයට එකඟ වූවහොත් මිස, සමගිකරුගේ** ගාස්තු අයි. සී. එස්. අයි. ඩී. සමගි කිරීම් වලට අදාළ අනුප්‍රමාණ පදනම් කරගෙන නිශ්චය කළ යුතු ය. සමගි කිරීමේ කටයුතුවල ගාස්තු සහ **වෙනත්** පිරිවැය පාර්ශ්ව කරුවන් විසින් සමසේ කොටස් කර ගත යුතු ය. එක් එක් පාර්ශ්වය විසින් තම තමන්ගේ වියදම් දැරිය යුතු ය.

4 වන ව්‍යවස්ථාව : බේරුම් කිරීම

(අ) බේරුම් කිරීම අපේක්ෂා කරන පාර්ශ්වකරු (ඉල්ලුම්කරු) විසින් ආරාවුලේ අනෙකුත් පාර්ශ්වකරුට (වගඋත්තරකරු) හෝ පාර්ශ්වකරුවන්ට යොමු කර යවන දැන්වීමක් මගින් බේරුම් කිරීමේ නඩු කටයුතු ආරම්භ කළ යුතු ය. ආරාවුලේ ස්වභාවය අපේක්ෂිත සහනය සහ ඉල්ලුම්කරු විසින් පත් කරන ලද බේරුම්කරුගේ නම එම දැන්වීමේ නිශ්චිතව දක්වා තිබිය යුතු ය. දැන්වීම් ලැබුණු **දිනයෙන් දින තිහක් ඇතුළත වගඋත්තරකරු විසින් පත් කරන ලද බේරුම්කරු** ගේ නම වගඋත්තරකරු විසින් ඉල්ලුම්කරුට දැන්විය යුතු ය. දෙවන බේරුම්කරු පත් කළ දිනයෙන් දින 30 ක කාල පරිච්ඡේදයක් ඇතුළත පාර්ශ්වකරුවන් දෙදෙනා විසින් බේරුම් කිරීමේ විනිශ්චයාධිකාරයේ (විනිශ්චයාධිකාරයේ) සභාපති වශයෙන් ක්‍රියා කළ යුතු 3 වන බේරුම්කරුවකු පත් කළ යුතු ය.

**(ආ) දැන්වීමේ දිනයෙන් දින හැටක් ඇතුළත විනිශ්චයාධිකාරය සංස්ථාපනය** වී නැත්නම් ද බේරුම්කරු පත් කරනු ලැබූ හෝ සභාපති තෝරා පත් කර ගනු ලැබ නැත්නම් ද පාර්ශ්වකරුවන් විසින් හවුලේ කරනු ලබන ඉල්ලීමක් මත අයි. ඩී. එස්. අයි. ඩී. ප්‍රධාන ලේකම් විසින් ඔවුන් පත් කරනු ලැබිය යුතු ය. එවැනි **හවුල් ඉල්ලීමක් නැත්නම් හෝ ඉල්ලීමෙන් දින තිහක් ඇතුළත එම පත්වීම** කිරීම මහා ලේකම්වරයා විසින් පැහැර හැර ඇත්නම් හෝ, එම පත්වීම් කරන ලෙස දෙපාර්ශ්වයෙන් එක් පාර්ශ්වයක් විසින් ජාත්‍යන්තර අධිකරණයේ සභාපතිවරයාගෙන් ඉල්ලා සිටිය හැකි ය.

(ඇ) ආරාවුල පිළිබඳ විභාගය ආරම්භ වූ පසුව කිසිම පාර්ශ්වකරුවකුට තමන් විසින් පත් කරන ලද බේරුම්කරු වෙනස් කිරීමේ අයිතිවාසිකම නැත. (විනිශ්චයාධි කාරයේ සභාපති ඇතුළුව) යම් බේරුම්කරුවකු ඉල්ලා අස් වූවහොත්, මියගියහොත් **හෝ අබලතාවකට පත් වූවහොත්, ඔහුගේ පූර්වගාමියා පත් කිරීමේ දී අනුගමනය** කළ ක්‍රමයටම අනුප්‍රාප්තිකයකු පත් කරනු ලැබිය යුතු අතර, ඒ අනුප්‍රාප්තිකයා **අනුප්‍රාප්ත වන බේරුම්කරුට තිබූ බලතල හා කාර්යයම එම අනුප්‍රාප්තිකයාට ද සතු** වන්නේ ය.

(ඈ) විනිශ්චයාධිකාරයේ ප්‍රථම රැස්වීම සභාපතිවරයා විසින් තීරණය කරනු **ලබන වේලාවක දී සහ ස්ථානයක දී පැවැත්විය යුතු ය. ඊට පසුව විනිශ්චයාධි කාරයේ රැස්වීම් පවත්වන ස්ථාන සහ දින විනිශ්චයාධිකරණය විසින් ම තීරණය කර ගත යුතු ය.**

(ඉ) වෙනස් ආකාරයකට, මේ ඇමුණුමේ විධිවිධාන සලසා ඇත්නම් හෝ පාර්ශ්වකරුවන් විසින් එකඟත්වයකට පත් වී ඇත්නම් හෝ මිස, විනිශ්චයාධිකාරය විසින් එහි කාර්ය පටිපාටිය තීරණය කර ගත යුතු අතර, මේ කාරණයේ දී රාජ්‍යය සහ වෙනත් රාජ්‍යවල වැසියන් අතර ඇති වන ආයෝජන ආරවුල් සමථය කට පත් කිරීමේ සම්මුතිය අනුව පිළිගන්නා ලද බේරුම් කිරීමේ රීති ගුරු කොට ගත යුතු ය.

(ඊ) විනිශ්චයාධිකාරය සහ කාර්යක්ෂමතාව පිළිබඳ විනිශ්චයකරු විය යුතු ය. එහෙත් එම ආරවුල 56 වන වගන්තිය යටතේ මණ්ඩලයේ හෝ සභාවේ අධිකරණ බලය ඇතුළතට නොවන බවට හෝ මේ ඇමුණුමේ 1 වන ව්‍යවස්ථාව යටතේ වූ ගිවිසුමක නම් කරන ලද අධිකරණ හෝ බේරුම් කිරීමේ මණ්ඩලයක අධිකරණ බලය යටතට වැටෙන බවට විරෝධතාවක් මතු කරනු ලැබ එම විරෝධතාව අව්‍යාජ බවට විනිශ්චයාධිකාරය සෑහීමට පත් වුවහොත් එම විරෝධතාව විනිශ්චයාධිකාරය විසින් අවස්ථාවෝචිත පරිදි මණ්ඩලයට හෝ සභාවට හෝ නම් කළ ආයතනයට හෝ යොමු කරනු ලැබිය යුතු අතර, එම කාරණය සම්බන්ධයෙන් තීරණයක් කරන තුරු බේරුම් කිරීමේ නඩු කටයුතු නතර කළ යුතු ය. එසේ ලැබෙන තීරණය විනිශ්චයාධිකාරය කෙරෙහි බන්ධනදායි විය යුතු ය.

(උ) මේ ඇමුණුමේ විෂය පථය ඇතුළත වූ යම් ආරවුලක දී විනිශ්චයාධිකාරය විසින් මේ සම්මුතියේ විධිවිධාන, ආරවුලේ පාර්ශ්වකරුවන් අතර වූ යම් අදාළ ගිවිසුමක්, ඒජන්සියේ අතුරු ව්‍යවස්ථා හා නියෝග, ජාත්‍යන්තර නීතියේ අදාළ කළ හැකි රීති, අදාළ සාමාජිකයාගේ අභ්‍යන්තර නීතිය සහ ආයෝජන ගිවිසුමක් ඇත්නම් එම ගිවිසුමේ විධිවිධාන ද අදාළ කර ගත යුතු ය. මේ සම්මුතියේ විධිවිධානවලට හානියක් නොමැතිව, ඒජන්සිය සහ අදාළ සාමාජිකයන් එකඟ වන්නේ නම් මෙම ආරවුල තීරණය කළ හැකි ය. නීතිය නිශ්ශබ්ද වීම හෝ නොපැහැදිලිවීමේ හේතුව මත විනිශ්චයාධිකාරය විසින් තීන්දුවක් නොදිය යුතු ය.

(ඌ) විනිශ්චයාධිකාරය විසින් සියලුම පාර්ශ්වකරුවන්ට සාධාරණව සවන් දිය යුතු ය. විනිශ්චයාධිකාරයේ සියලුම තීරණ බහුතර ඡන්දයෙන් ගත යුතු අතර එම තීරණවලට පදනම් වූ හේතු සඳහන් කරනු ලැබිය යුතු ය. විනිශ්චයාධිකාරයේ ප්‍රදානය ලියවිල්ලකින් දිය යුතු අතර, එය යටත් පිරිසෙයින් බේරුම්කරුවන් දෙදෙනකු විසින්වත් අත්සන් කරනු ලැබිය යුතු ය. එහි පිටපතක් එක් එක් පාර්ශ්වකරුට යවනු ලැබිය යුතු ය. ප්‍රදානය අවසානාත්මක හා පාර්ශ්වකරුවන් කෙරෙහි බන්ධනදායි විය යුතු අතර එය අභියාචනයට, අවලංගු කිරීමට හෝ ප්‍රතිශෝධනයට යටත් නොවිය යුතු ය.

(එ) ප්‍රදානයක අර්ථය හෝ විෂය පථය සම්බන්ධයෙන් පාර්ශ්වකරුවන් අතර යම් ආරවුලක් පැන නැගුනහොත් එම ප්‍රදානය දීමෙන් දින 60 ක් ඇතුළත දෙපාර්ශ්වයෙන් එක් පාර්ශ්වයක් විසින් එම ප්‍රදානය දුන් විනිශ්චයාධිකාරයේ සභාපතිවරයාට ලියවිල්ලක් මගින් ඉදිරිපත් කරනු ලබන ඉල්ලුම් පත්‍රයක් මගින් එම ප්‍රදානයේ අර්ථ නිරූපනයක් ඉල්ලා සිටිය හැකි ය. සභාපතිවරයා විසින්, හැකි නම් එම ඉල්ලීම එම ප්‍රදානය දුන් විනිශ්චයාධිකාරය වෙතට යොමු කළ යුතු අතර ඉල්ලුම් පත්‍රය ලැබී දින 60 ක් ඇතුළත එම විනිශ්චයාධිකාරය රැස් කළ යුතු ය. මෙය කළ නොහැකි නම් ඉහත (අ) සිට (ඇ) දක්වා වූ වගන්තිවල විධිවිධානවලට අනුව අලුත් විනිශ්චයාධිකාරයක් සංස්ථාපනය කළ යුතු ය. ඉල්ලා සිටින ලද අර්ථ නිරූපනය පිළිබඳ විනිශ්චයාධිකාරයේ තීරණය තෙක් විනිශ්චයාධිකාරය විසින් ප්‍රදානය බලාත්මක කිරීම නතර කළ හැකි ය.

(ඒ) මේ ව්‍යවස්ථාව අනුව දෙන ලද සෑම ප්‍රදානයක්ම ස්වකීය රාජ්‍යයේ අධිකරණයක නඩු තීන්දුවක් වූවාක් මෙන් එහි දේශය තුළ බන්ධනදායි සහ බලාත්මක කළ හැකි ප්‍රදානයක් වශයෙන් එක් එක් සාමාජිකයා විසින් ගත යුතු ය. ප්‍රදානය ක්‍රියාවේ යෙදවීම, එම ක්‍රියාවේ යෙදවීම අපේක්ෂා කරන දේශය අයත් වන රාජ්‍යයේ නඩු තීන්දු ක්‍රියාවේ යෙදවීම සම්බන්ධයෙන් ඇති නීති වලින් පාලනය විය යුතු අතර, එය ක්‍රියාවේ යෙදවීම මුක්තිය සම්බන්ධයෙන් වලංගුව පවත්නා නීතියේ බලය හීන කරන්නක් ලෙස සලකනු නොලැබිය යුතු ය.

(ආ) පාර්ශ්වකරුවන් වෙනත් ආකාරයකට එකඟ වුවහොත් මිස, බේරුම්කරුවන්ට ගෙවිය යුතු ගාස්තු සහ පාරිශ්‍රමිකය අයි. සී. එස්. අයි. ඩී. බේරුම් කිරීම්වලට අදාළ අනුප්‍රමාණ අනුව ගෙවිය යුතු ය. බේරුම් කිරීම නඩු කටයුතු සම්බන්ධයෙන් එක් එක් පාර්ශවයේ වියදම් එක් එක් පාර්ශ්වය විසින් දැරිය යුතු ය. විනිශ්චයාධිකාරය විසින් වෙනත් ආකාරයකට තීරණය කළහොත් මිස විනිශ්චයාධිකාරයේ ගාස්තු පාර්ශ්වකරුවන් විසින් සමාන කොටස්වලින් ගෙවිය යුතු ය. විනිශ්චයාධිකාරයේ ගාස්තු බෙදාහැරීම සම්බන්ධයෙන් හෝ එම ගාස්තු ගෙවීමේ පිළිවෙල සම්බන්ධයෙන් වූ යම් ප්‍රශ්නයක් විනිශ්චයාධිකාරය විසින් තීරණය කළ යුතු ය.

5 වන ව්‍යවස්ථාව: කැඳවීම් නියෝග භාර දීම

මේ ඇමුණුම යටතේ වූ යම් නඩු කටයුත්තකට සම්බන්ධ යම් දැන්වීමක් හෝ කැඳවීම් නියෝගයක් ලියවිල්ලක් වශයෙන් ඉදිරිපත් කළ යුතු ය. එය මේ සම්මුතියේ 38 වන ව්‍යවස්ථාව අනුව අදාළ සාමාජිකයා විසින් නම් කරන ලද බලධරයා වෙත ඒජන්සිය විසින් එය භාර දිය යුතු අතර, එම සාමාජිකයා විසින් එය ඒජන්සියේ ප්‍රධාන කාර්යාලයේ දී භාර දිය යුතු ය.

"අ" උපලේඛනය

සාමාජිකත්වය හා දායකවීම

පළමුවන ගණය

| රට | කොටස් ගණන | | දායකත්වය (එස්ඩීආර් මිලියන) | |
|---|---|---|---|---|
| ඕස්ට්‍රේලියාව ... ... | 1,713 | | 17.13 | |
| ඔස්ට්‍රියා ... ... | 775 | | 7.75 | |
| බෙල්ජියම ... ... | 2,030 | | 20.30 | |
| කැනඩාව ... ... | 2,965 | | 29.65 | |
| ඩෙන්මාර්කය ... ... | 718 | | 7.18 | |
| ෆින්ලන්තය ... ... | 600 | | 6.00 | |
| ප්‍රංශය ... ... | 4,860 | | 48.60 | |
| ප්‍රජාතාන්ත්‍රවාදි ජර්මන් ජනරජය ... | 5,071 | | 50.71 | |
| අයිස්ලන්තය ... ... | 90 | | 0.90 | |
| අයර්ලන්තය ... ... | 369 | | 3.69 | |
| ඉතාලිය ... ... | 2,820 | | 28.20 | |
| ජපානය ... ... | 5,095 | | 50.95 | |
| ලක්සම්බර්ග් | 116 | | 1.16 | |
| නෙදර්ලන්තය ... ... | 2,169 | | 21.69 | |
| නවසීලන්තය ... ... | 513 | | 5.13 | |
| නෝර්වේ ... ... | 699 | | 6.99 | |
| දකුණු අප්‍රිකාව ... ... | 943 | | 9.43 | |
| ස්වීඩනය ... ... | 1,049 | | 10.49 | |
| ස්විට්සර්ලන්තය ... ... | 1,500 | | 15.00 | |
| එක්සත් රාජධානිය ... | 4,860 | | 48.60 | |
| එක්සත් ජනපදය ... ... | 20,519 | | 205.19 | |
| | | 59,473 | | 594.73 |

දෙවන ගණය

| රට | කොටස් ගණන | දායකත්වය (එස්ඩීආර් මිලියන) |
|---|---|---|
| ඇෆ්ගනිස්ථානය ... ... | 118 | 1.18 |
| ඇල්ජීරියාව ... ... | 649 | 6.49 |
| ඇන්ටිගුවා සහ බාර්බියුඩා ... | 50 | 0.50 |
| ආජන්ටිනා ... ... | 1,254 | 12.54 |
| බහමාස් ... ... | 100 | 1.00 |
| බහරේන් ... ... | 77 | 0.77 |
| බංගලාදේශ් ... ... | 340 | 3.40 |
| බාබඩෝස් ... ... | 68 | 0.68 |
| බෙලීස් ... ... | 50 | 0.50 |
| බෙනින් ... ... | 61 | 0.61 |
| භූටාන් ... ... | 50 | 0.50 |

| රට | කොටස් ගණන | දායකත්වය (එස්ඩීආර් මිලියන) |
|---|---|---|
| බොලිවියා ... ... | 125 | 1.25 |
| බොට්ස්වානා ... ... | 50 | 0.50 |
| බ්‍රසීලය ... ... | 1,479 | 14.79 |
| බර්කිනා ෆාසෝ ... ... | 61 | 0.61 |
| බුරුමය ... ... | 178 | 1.78 |
| බුරුන්ඩි ... ... | 74 | 0.74 |
| කැමරූන් ... ... | 107 | 1.07 |
| කේප් වර්ඩ් ... ... | 50 | 0.50 |
| මධ්‍යම අප්‍රිකානු ජනරජය ... | 60 | 0.60 |
| චැඩ් ... ... | 60 | 0.60 |
| චිලී ... ... | 485 | 4.85 |
| චීනය ... ... | 3,138 | 31.38 |
| කොලොම්බියා ... .. | 437 | 4.37 |
| කොමොරෝස් ... ... | 50 | 0.50 |
| කොංගෝ මහජන ජනරජය ... | 65 | 0.65 |
| කොස්ටරිකා ... ... | 117 | 1.17 |
| සයිප්‍රස් ... ... | 104 | 1.04 |
| ජිබූටි ... ... | 50 | 0 50 |
| ඩොමිනිකා ... ... | 50 | 0.50 |
| ඩොමිනිකන් ජනරජය ... | 147 | 1.47 |
| ඉක්වදෝරය ... ... | 182 | 1.28 |
| ඊජිප්තු අරාබි ජනරජය ... | 459 | 4.59 |
| එල් සැල්වදෝරය ... ... | 122 | 1.22 |
| නිරක්ෂයීය ගිනියාව... ... | 50 | 0.50 |

* දෙවන ගණය යටතේ ලැයිස්තුගත කර ඇති රටවල් මේ සම්මුතියේ කාර්යය සඳහා දියුණුවන සාමාජික රටවල් වෙයි.

| | | |
|---|---|---|
| ඉතියෝපියා ... ... | 70 | 0.70 |
| ෆීජි ... ... | 71 | 0.71 |
| ගැබන් ... ... | 96 | 0.96 |
| ගැම්බියා ... ... | 50 | 0.50 |
| ඝානා ... ... | 245 | 2.45 |
| ග්‍රීසිය ... ... | 280 | 2.80 |
| ග්‍රෙනාඩා ... ... | 50 | 0.50 |
| ගෝතමාලා ... ... | 140 | 1.40 |
| ගිනියා ... ... | 91 | 0.91 |
| ගිනි බිසෝ ... ... | 50 | 0.50 |
| ගයානා ... ... | 84 | 0.84 |
| හයිටි ... ... | 75 | 0.75 |
| හොන්ඩුරාස් ... ... | 101 | 1.01 |
| හන්ගේරියාව ... ... | 564 | 5.64 |
| ඉන්දියාව ... ... | 3,048 | 30.48 |
| ඉන්දුනීසියාව ... ... | 1,049 | 10.49 |
| අයිරාන් ඉස්ලාම් ජනරජය ... | 1,659 | 16.59 |

| රට | කොටස් ගණන | දායකත්වය (එස්ඩීආර් මිලියන) |
|---|---|---|
| ඉරාකය ... ... | 350 | 3.50 |
| ඊශ්‍රායෙල් ... ... | 474 | 4.74 |
| අයිවරි කෝස්ට් ... ... | 176 | 1.76 |
| ජැමෙයිකා ... ... | 181 | 1.81 |
| ජෝර්ඩාන් ... ... | 97 | 0.97 |
| ප්‍රජාතන්ත්‍රවාදී කම්පුචියාව ... | 93 | 0.93 |
| කිනියාව ... ... | 172 | 1.72 |
| කොරියානු ජනරජය ... | 449 | 4.49 |
| කුවේට් ... ... | 930 | 9.30 |
| ලාඕ මහජන ප්‍රජාතන්ත්‍රවාදී ජනරජය | 60 | 0.60 |
| ලෙබනන් ... ... | 142 | 1.42 |
| ලෙසෝතෝ ... ... | 50 | 0.50 |
| ලයිබීරියාව ... ... | 84 | 0.84 |
| ලිබියානු අරාබි ජැමරියා ... | 549 | 5.49 |
| මැඩගස්කරය ... ... | 100 | 1.00 |
| මලාවි ... ... | 77 | 0.77 |
| මැලයාසියාව ... ... | 579 | 5.79 |
| මාලදිවයින් ... ... | 50 | 0.50 |
| මාලි ... ... | 81 | 0.81 |
| මෝල්ටා ... ... | 75 | 0.75 |
| මොරිටේනියා ... ... | 63 | 0.63 |
| මුරිසිය ... ... | 87 | 0.87 |
| මැක්සිකෝව ... ... | 1,192 | 11.92 |
| මොරොක්කෝව ... ... | 348 | 3.48 |
| මොසැම්බික් ... ... | 97 | 0.97 |
| නේපාලය ... ... | 69 | 0.69 |
| නිකරගුවා ... ... | 102 | 1.02 |
| නයිජර් ... ... | 62 | 0.62 |
| නයිජීරියාව ... ... | 844 | 8.44 |
| ඕමාන් ... ... | 94 | 0.94 |
| පකිස්ථානය ... ... | 660 | 6.60 |
| පැනමා ... ... | 131 | 1.31 |
| පැපුවා නව ගිනියාව ... | 96 | 0.96 |
| පැරගුවේ ... ... | 80 | 0.80 |
| පේරු ... ... | 373 | 3.73 |
| පිලිප්පීනය ... ... | 484 | 4.84 |
| පෘතුගාලය ... ... | 382 | 3.82 |
| ක්වාටාර් ... ... | 137 | 1.37 |
| රොමේනියා ... ... | 555 | 5.55 |
| රුවන්ඩා ... ... | 75 | 0.75 |
| සෙන්ට් ක්‍රිස්ටෝපර් සහ නෙවිස් ... | 50 | 0.50 |
| සෙන්ට් ලුසියා ... ... | 50 | 0.50 |

| රට | කොටස් ගනණ | | දායකත්වය (එස්ඩීආර් මිලියන) | |
|---|---|---|---|---|
| සෙන්ට් වින්සන්ට් | 50 | | 0.50 | |
| සාඕ ටොමේ සහ ප්‍රින්සිපේ | 50 | | 0.50 | |
| සවුදි අරාබිය | 3,137 | | 31.37 | |
| සෙනිගාල් | 145 | | 1.45 | |
| සෙචලීස් | 50 | | 0.50 | |
| සියෙරා ලියොන් | 75 | | 0.75 | |
| සිංගප්පූරුව | 154 | | 1.54 | |
| සොලමන් දූපත් | 50 | | 0.50 | |
| සෝමාලියා | 78 | | 0.78 | |
| ස්පාඤ්ඤය | 1,285 | | 12.85 | |
| ශ්‍රී ලංකාව | 271 | | 2.71 | |
| සුඩානය | 206 | | 2.06 | |
| සුරිනාම් | 82 | | 0.82 | |
| සිරියානු අරාබි ජනරජය | 168 | | 1.68 | |
| ස්වාසිලන්තය | 58 | | 0.58 | |
| ටැන්සානියාව | 141 | | 1.41 | |
| තායිලන්තය | 421 | | 4.21 | |
| ටෝගෝ | 77 | | 0.77 | |
| ට්‍රිනිඩෑඩ් සහ ටොබැගෝ | 203 | | 2.03 | |
| ටියුනීසියාව | 156 | | 1.56 | |
| තුර්කිය | 462 | | 4.62 | |
| එක්සත් අරාබි එමීර් රාජ්‍යය | 372 | | 3.72 | |
| උගන්ඩාව | 132 | | 1.32 | |
| උරුගුවේ | 202 | | 2.02 | |
| වනුආටු | 50 | | 0.50 | |
| වෙනිසියුලාව | 1,427 | | 14.27 | |
| වියට්නාමය | 220 | | 2.20 | |
| බටහිර සැමෝආ | 50 | | 0.50 | |
| යේමන් අරාබි ජනරජය | 67 | | 0.67 | |
| යේමන් මහජන ප්‍රජාතන්ත්‍රවාදී ජනරජය | 115 | | 1.15 | |
| යුගෝස්ලාවියාව | 635 | | 6.35 | |
| සයිරේ | 338 | | 3.38 | |
| සැම්බියා | 318 | | 3.18 | |
| සිම්බාබ්වේ | 236 | | 2.36 | |
| | | 40,527 | | 405.72 |
| එකතුව | | 1,00,000 | | 1,000.00 |

## "අ" උපලේඛනය

### අධ්‍යක්ෂවරුන් තෝරා පත් කර ගැනීම

(1) අධ්‍යක්ෂ ධුරය සඳහා අපේක්ෂකයන් අධිපතිවරුන් විසින් නම් කරනු ලැබිය යුතු ය. එහෙත් එක් එක් අධිපතිවරුන් විසින් නම් කරනු ලැබිය හැකි වන්නේ එක් තැනැත්තකු පමණ ය.

(2) අධිපතිවරුන්ගේ ඡන්දයෙන් අධ්‍යක්ෂවරුන් තෝරා පත් කර ගත යුතු ය.

(3) අධ්‍යක්ෂවරුන් තෝරා පත් කර ගැනීම සඳහා ඡන්දය දීමේ දී සෑම අධිපතිවරයකුම, එම අධිපතිවරයා විසින් නියෝජනය කරනු ලබන සාමාජිකයා විසින් 40 වන ව්‍යවස්ථාවේ (අ) වගන්තිය යටතේ දීමට හිමිකම ඇති සියලු ඡන්ද, එක් අපේක්ෂකයකුට දිය යුතු ය.

(4) අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාවෙන් හතරෙන් එකක්, වැඩිම කොටස් සංඛ්‍යාවක් හිමි සාමාජිකයන්ගේ එක් එක් අධිපතිවරයා විසින් එක් අධ්‍යක්ෂවරයා බැගින්, වෙන වෙනම තෝරා පත් කර ගත යුතු ය. මුළු අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව හතරෙන් බෙදන සංඛ්‍යාවක් නොවේ නම්, එසේ තෝරා පත් කර ගනු ලැබිය යුතු අධ්‍යක්ෂවරුන් ගණන ඊට අඩු ඊළඟ හතරෙන් බෙදිය හැකි සංඛ්‍යාවේ හතරෙන් එක විය යුතු ය.

5. ඉතිරි අධ්‍යක්ෂවරුන්, මේ උපලේඛනයේ 6 සිට 11 දක්වා වූ ඡේදවල විධිවිධානවලට අනුකූලව අනිකුත් අධිපතිවරුන් විසින් තෝරා පත් කර ගත යුතු ය.

6. නාම යෝජනා කරන ලද අපේක්ෂකයන්ගේ සංඛ්‍යාව එසේ තෝරා පත් කර ගැනීම සඳහා ඉතිරිවන අධ්‍යක්ෂවරුන්ගේ සංඛ්‍යාවට සමාන වේ නම්, සියලුම අපේක්ෂකයන් ප්‍රථම ඡන්දය දීමේ දී ම තෝරා පත් කර ගත යුතු ය එහෙත් යම් අපේක්ෂකයකුට සභාව විසින් තීරණය කරන ලද මුළු ඡන්ද සංඛ්‍යාවෙන් උපරිම ප්‍රතිශතයට වැඩ සංඛ්‍යාවක් ලැබී ඇත් නම්, එම තෝරා පත් කර ගැනීම සඳහා සභාව විසින් තීරණය කරන ලද මුළු ඡන්ද සංඛ්‍යාවෙන් අවම ප්‍රතිශතය ලැබූ අපේක්ෂකයා හෝ අපේක්ෂකයන් තෝරා පත් කර ගනු නොලැබිය යුතු ය.

(7) නාම යෝජනා කරන ලද අපේක්ෂකයන් සංඛ්‍යාව, තෝරා පත් කර ගැනීම සඳහා එසේ ඉතිරිව ඇති අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාවට වඩා වැඩි නම්, සභාව විසින් තීරණය කරන ලද මුළු ඡන්ද සංඛ්‍යාවේ ප්‍රතිශතයට වඩා අඩු ප්‍රමාණයක් ඡන්ද ලැබූ යම් අපේක්ෂකයකු හැර, වැඩිම ඡන්ද සංඛ්‍යාවක් ලබන අපේක්ෂකයන් තෝරා පත් කර ගනු ලැබිය යුතු ය.

(8) එසේ ඉතිරි සියලුම අධ්‍යක්ෂවරුන් පළමු ඡන්ද විමසීමේ දී තෝරා පත් කර ගනු නොලැබුවහොත් දෙවැනි ඡන්ද විමසීමක් පැවැත්විය යුතු ය. පළමුවන ඡන්ද විමසීමේ දී තෝරා පත් කර ගනු නොලැබූ අපේක්ෂකයා හෝ අපේක්ෂකයන් නැවත වරක් තෝරා පත් කර ගනු ලැබීමට සුදුසු විය යුතු ය.

(9) දෙවන ඡන්ද විමසීමේ දී ඡන්දය දීම (i) පළමුවන ඡන්ද විමසීමේ දී තෝරා පත් කර ගනු නොලැබූ අපේක්ෂකයකුට ඡන්දය දී ඇති අධිපතිවරුන්ට සහ (ii) තමන්ගේ ඡන්ද ගණන් ගැනීමට පළමුව සභාව විසින් තීරණය කරන ලද උපරිම ඡන්ද ප්‍රමාණය එවකටත් ලබා සිටි තෝරා පත් කර ගත් අපේක්ෂකයකුට ඡන්දය දී ඇති අධිපතිවරුන්ට පමණක් සීමා විය යුතු ය.

(10) යම් තෝරා පත් කර ගත් අපේක්ෂකයකු උපරිම ඡන්ද ප්‍රතිශතයට වැඩි ඡන්ද සංඛ්‍යාවක් ලබා ගෙන ඇති බව තීරණය කිරීමේ දී එම අපේක්ෂකයාට වැඩිම ඡන්ද සංඛ්‍යාවක් දුන් අධිපතිවරයාගේ ඡන්ද පළමුවෙන් ද ඊළඟ වැඩිම ඡන්ද සංඛ්‍යාව දුන් අධිපතිවරයාගේ ඡන්ද සංඛ්‍යාව ඊළඟට ද යනාදී වශයෙන් එම ප්‍රතිශතයට ළඟා වන තෙක් ගණන් ගත යුතු ය.

(ii) දෙවන ඡන්ද විමසීමෙන් පසුව ඉතිරි සියලුම අධ්‍යක්ෂවරුන් තේරී පත්වී නොමැති නම් ඉතිරි අධ්‍යක්ෂවරුන් තේරී පත් වන තෙක් එම මූලධර්ම යටතේ ම වැඩිදුර ඡන්ද විමසීම් පැවැත්විය යුතු ය. එහෙත් අධ්‍යක්ෂකවරයකු පමණක් තෝරා පත් කර ගැනීමට ඉතිරිව ඇති විටෙක මේ අධ්‍යක්ෂවරයා ඉතිරි ඡන්දවලින් සාමාන්‍ය බහුතරයකින් තෝරා පත් කර ගනු ලැබිය යුතු අතර ඔහු ඒ සියලු ඡන්දවලින් තෝරා පත් කර ගනු ලැබූ ලෙස සැලකිය යුතු ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත් වල සහ පනත් වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 177 කි. (විදේශීය) රු. 236 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.